# වාර්ෂික වාර්තාව
# 2023

## ජාතික තරුණ සේවා සභාව

හැඳින්වීම ........ i
දැක්ම හා මෙහෙවර ........ ii
අරමුණු ........ iii
1. ජාතික තරුණ සේවා සභාව ........ 1
1.1. සංවිධාන ව්‍යුහය ........ 2
1.2. සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛනය ........ 3
2. විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් ........ 4
3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ විස්තරය ........ 5-8
3.1. ජාතික තරුණ සේවා සභාවේ 2023 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම් පිළිබඳ විස්තර ........ 5
3.2. ජාතික තරුණ සේවා සභාවේ 2023 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම් ........ 6
3.3. ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රු.මිලියන) ........ 7
3.4. සංවර්ධන වැඩසටහන් වියදම් සාරංශය - 2023 ........ 8
4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2023 ........ 9-29
4.1. සෞන්දර්ය කුසලතා සංවර්ධනය ........ 10-11
4.2. ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා ........ 12-13
4.3. තරුණ සංවිධාන හා සංවර්ධනය ........ 14-16
4.4. ජාතික යෞවන තිළිණ ප්‍රදාන ........ 16-17
4.5. ක්‍රීඩා කුසලතා සංවර්ධනය ........ 18-19
4.6. කාර්මික හා වෘත්තීය පුහුණු වැඩසටහන ........ 19-20
4.7. විභාග හා ඇගයීම් ........ 20-21
4.8. තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය ........ 21-22
4.9. තරුණ කෘෂි සංවර්ධනය ........ 22-23
4.10. මාධ්‍ය ප්‍රචාරණය ........ 23
4.11. නිස්කෝ විඩියෝ වැඩසටහන ........ 23
4.12. පර්යේෂණ, සැළසුම් හා ප්‍රගති සමාලෝචනය ........ 24
4.13. තොරතුරු තාක්ෂණ සංවර්ධනය. ........ 24
4.14. වෘත්තීය මාර්ගෝපදේශන , උපදේශනය හා පුහුණු වැඩසටහන ........ 25
4.15. විශේෂ ව්‍යාපෘති ........ 25-26

4.16. කාර්යසාධන ඇගයීම් හා කාර්ය මණ්ඩල පුහුණු ක්‍රියාකාරකම්............................................27-29

5. පාලන හා මානව සම්පත් කළමනාකරණය ..................................................................... 30-39

5.1. ආයතනික කටයුතු.............................................................................................30-36

5.2. ප්‍රසම්පාදන කටයුතු .................................................................................................37

5.3. ප්‍රවාහන කටයුතු ....................................................................................................37

5.4. අභ්‍යන්තර විගණක කටයුතු.................................................................................37-38

5.5. ලේකම් කාර්යාලය හා සම්බන්ධ කටයුතු ...................................................................38

5.6. නීති විමර්ශන කටයුතු. .......................................................................................38-39

5.7. ඉදිකිරීම් හා නඩත්තු කටයුතු. ..................................................................................39

5.8. තිරසර සංවර්ධන අරමුණු (SDG) කාර්ය සාධනය ........................................................39-40

5.9. විශේෂ ජයග්‍රහණ හා අභියෝග - 2023 .......................................................................40

6. කාර්ය සාධන වාර්තාව 2023 ........................................................................... 41-42

6.1. ආයතනයේ කාර්ය සාධනය.....................................................................................41-42

6.2. කෙටිකාලීන හා මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග .....................................................................42

7. 2023 වර්ෂයට අදාළ විගණන විමසුම් මඟින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ....................................................................... 42-45

8. ආශ්‍රිත වාර්තා / ලේඛන.........................................................................................46

9. ඇමුණුම 01 - විගණක කමිටු වාර්තාව ..................................................................47

10. ඇමුණුම 02 - මූල්‍ය විගණක ප්‍රකාශය ............................................................... 48-49

11. ඇමුණුම් 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2022 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූලා ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව............................................ 50-62

# හැඳින්වීම

1979 අංක 69 දරණ පාර්ලිමේන්තු පනත ප්‍රකාරව ජාතික තරුණ සේවා සභාව පිහිටුවන ලදී. ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා කැප වූ ප්‍රධානතම රාජ්‍ය ආයතනයයි. මෙරට තරුණ සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා මෙම ආයතනය ආරම්භයේ සිට මේ දක්වා ඉතා සක්‍රිය දායකත්වයක් ලබා දෙමින් සිටී. මූලස්ථානය මහරගම නගරය කේන්ද්‍ර කරගනිමින් පිහිටා ඇති අතර, තරුණ තරුණියන්ට වඩාත් සමීපව සේවා සැපයීම වස් පළාත් මට්ටමින් කාර්යාල 09 ක් ද, දිස්ත්‍රික්කාර්යාල 26 ක් හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල මධ්‍යස්ථාන 59 ක් ද දිවයිනම ආවරණය වන පරිදි පුරා පිහිටුවා ඇත.

විශේෂයෙන්, කාලීනව සිදුවන වන සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික (කලාව), ක්‍රීඩා හා තාක්ෂණික ක්ෂේත්‍රයන් හී නව ප්‍රවනතා සැළකිල්ලට ගනිමින් එයට අදාළ වූ තරුණ සංවර්ධන ප්‍රවේශයන් දියත් කිරීම කෙරෙහි මේවන විට අවධානයට යොමුවී ඇත. ඒ අනුව, වත්මන් තරුණ අවශ්‍යතා වලට ගැළපෙන නව වැඩසටහන්/ව්‍යාපෘති රැසක් සහස්‍ර සංවර්ධන හා ප්‍රමිතිගත ඉලක්ක, තිරසර සංවර්ධන අරමුණු (SDG Goals) සාක්ශාත් වන අයුරින් **"SMART YOUTH"** සංකල්පය පෙරදැරි කරගනිමින් ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු වී ඇත. එහිදී තරුණ සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන්,සේවාවන්,ආයතනික පරිශ්‍රය මෙන්ම සේවා සපයන්නන්ගේ (නිලධාරීන්) දැනුම,ආකල්ප,කුසලතා ද නව්‍යකරණය කෙරේ.

මෙම කර්තව්‍යයන් යථාවත් කිරීම උදෙසා තරුණ තරුණියන් නවීන කෘෂි කර්මාන්තයට යොමු කිරීම, නව වෙළඳපොළ ආකර්ශනය කල හැකි ව්‍යවසායකයන් බවට තරුණයන් පත් කිරීම වෙනුවෙන් පුහුණු පාඨමාලා/වැඩමුළු පැවැත්වීම, තරුණයන්ගේ විභව ශක්තීන් ඉස්මතු කර, කුසලතා පරිපූර්ණත්වයට පත් කිරීම සඳහා ක්‍රීඩා හා සෞන්දර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නව තාක්ෂණික දැනුම සහිත වෘත්තීය පුහුණු ලබා දීම, තරුණ තරුණියන්ගේ මෙන්ම නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය කිරිම සඳහා පුහුණු වැඩසටහන් දියත් කිරීම, මෙරට තරුණයාට අන්තර්ජාතික අත්දැකීම් ලබාදීම වෙනුවෙන් අන්තර්ජාතික වැඩසටහන්,වැඩමුළු වලට තරුණයන් මෙන්ම නිලධාරීන්ට සහභාගිවීමට අවස්ථාව සළසාදීම, තරුණයාගේ දේශපාලනික අවබෝධය පුළුල් කිරීම උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, තරුණයාගේ අන්තර් සබඳතා ශක්තිමත් කිරීම සඳහා අවස්ථා සැපයීම හා ඒ වෙනුවෙන් දිවයින පුරා පිහිටි යෞවන සමාජ ජාලගත කිරීම, ස්වේච්ඡා සමාජ ක්‍රියාකාරකම් සඳහා අනුබල දීම, අන්තර් පුද්ගල, අන්තර් ආයතන සම්බන්ධීකරණයන් ගොඩනැංවීම, වෘත්තීය ලැදියාව මත පුහුණු පාඨමාලා සහ රැකියා අවස්ථා තෝරා ගැනීමට අවශ්‍යය මාර්ගෝපදේශ ලබාදීම, තරුණයා විෂයෙහි පවතින විවිධ ශාරීරික,මානසික හා සමාජීය ගැටළු නිරාකරණය සඳහා අවශ්‍යය මඟපෙන්වීම හා උපදේශනය සැපයීම ආදිය සිදු කෙරේ.

ඒ අනුව, තරුණයා ආර්ථික,සමාජීය,සංස්කෘතික,කායික හා මානසික වශයෙන් බලසතුකරණය කිරීම සඳහා වැඩසටහන් රාශියක් 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කර ඇති අතර ඒ පිළිබඳව අදාළ දත්ත හා තොරතුරු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ.

**දැක්ම**

බලසතු වූ ශ්‍රී ලාංකීය තරුණයෙක්.

**මෙහෙවර**

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොටගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තරුණයා සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

අරමුණු

1. ජාතික හැඟීම පිළිබඳ උද්යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.
2. ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.
3. ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
4. තරුණයන් අතර තරගකාරිත්වය හා ජයග්‍රහණය පිළිබඳ හැඟීම සඳහා දිරිගැන්වීම.
5. තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම ලබාදීම.
6. තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම
7. තරුණයන් අතර ශාරීරික ප්‍රාගුන්‍යය හා ක්‍රීඩා වර්ධනය සඳහා දිරි ගැන්වීම.
8. තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම.
9. බාධිත තරුණයන්ට සහය වීම.
10. රජයේ ආර්ථික සැළසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථාව සැලසීම.
11. ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සඳහා අවස්ථාව සැලසීම.
12. තරුණ සංවිධාන පිහිටුවීම සහ තරුණ සුබ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධාන වලට සහය වීම.
13. තරුණ සේවා ව්‍යාප්තිය සැළසුම් කිරීම,ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.
14. එක් එක් තරුණයාගේ ආවේනික ලක්ෂණ වර්ධනය කිරීම.


## 1. ජාතික තරුණ සේවා සභාව

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනය ජාතික තරුණ සේවා සභාව වේ.

<u>ජාතික තරුණ සේවා සභාව පිහිටුවීමට අදාළ පාර්ලිමේන්තු පනත් :-</u>

- 1967 වර්ෂයේ අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත.
- 1968 වර්ෂයේ අංක 52 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත.
- 1969 ජනවාරි 23 වන දින අංක 14837/6 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් පනතේ 26 වන ඡේදයට අනුව රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත් කිරීම.
- 1979 වර්ෂයේ අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත.
- 1979 දෙසැම්බර් මස 20 වන දින අංක 67/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1967 අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත අහෝසි කිරීම හා 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත ක්‍රියාත්මක කරන දිනය ප්‍රකාශයට පත් කිරීම.
- 1980 ජනවාරි මස 02 වන දින අංක 69/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත්කිරීම.
- 1986 මාර්තු මස 10 වන දින අංක 392/05 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ 1986 අංක 01 දරණ ජාතික තරුණ සේවා නියෝග ප්‍රකාශයට පත්කිරීම.
- 1990 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ජාතික තරුණ සේවා සභාවට අන්තර්ග්‍රහණය කිරීම.
- 2011 වසරේ ශ්‍රී ලංකා යූත් සංකල්පය ආරම්භ වීම.

## 1.1 සංවිධාන ව්‍යුහය



## 1.2 සභා අධ්‍යක්ෂ මණ්ඩල නාම ලේඛනය

| අ. අංක | නාම ලේඛනය | තනතුර |
|---|---|---|
| 01. | පසිඳු ගුණරත්න මහතා | සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් |
| 02. | ගාමිණී වික්‍රමපාල මහතා (2023.03.02 සිට 2023.03.16 දක්වා සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් වැඩ බැලීම.) | සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් |
| 03. | ආචාර්ය, තිරාන් සිරිපත් ද සිල්වා මහතා | සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් |
| 04. | ගාමිණී වික්‍රමපාල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 05. | ප්‍රදීප් ගමච්චිගේ මහතා (2023.01.27) දින සභා රැස්වීමෙන් පසු වෙනත් ස්ථානයක් වෙත මාරු කර ඇත) | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 06. | බි. කේ. චන්දිමා ජයසිංහ මෙය (2023.02.14 දින පත්කර ඇත) | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 07. | රංජිත් චන්ද්‍රසේකර මහතා (2023.01.27 පසුව විශ්‍රාම යන බව දන්වන ලදි) | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 08. | එච්.එච්.වී.එම්. සංජීවනී මහත්මිය (2023.02.24 දින පත් කර ඇත) | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 09. | එම්.එච්.ජී. බණ්ඩාර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 10. | මහාචාර්ය, සිසිල් කුමාරවඩු මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 11. | මහාචාර්ය, රංජිත් ප්‍රේමලාල් මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 12. | ආචාර්ය, අමල් ක්‍රිෂාන්ත ඉලේසිංහ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 13. | වෛද්‍ය, නිලංග ආසිරි වීරසිංහ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 14. | වෛද්‍ය, ප්‍රියන්ත පෙරේරා මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 15. | නීතිඥ, මධුර වෙල්ගම මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 16. | මේජර් ජෙනරාල්(විශ්‍රාමික), රාජිත අම්පේමොහොට්ටි මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 17. | තරංග නලීන් ගම්ලත් මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 18. | හේමන්ත ශ්‍රීලාල් මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 19. | එල්.බි. ඉසංක චතුරංග මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 20. | තිලක් කන්දේගම මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 21. | බී. එච්. එස්. කේ. චන්දිම මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 22. | ජානක අමරසිංහ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 23. | ප්‍රදීප් මාපලගම මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 24. | වසන්ත දුක්ගන්නාරාල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 25. | සුධීර රාජපක්ෂ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 26. | සුජානී බෝගොල්ලාගම මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 27. | එල්.පී.වී. එරන්ද ලියනගේ මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 28. | දූෂාන්ත විදූෂක මහබදුගේ මහතා (2022.08.16 පත් කර ඇත) | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

## 2. විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. බී.කේ.චන්දිමා ජයසිංහ මිය, - සභාපති
   නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,
   මුදල් අමාත්‍යාංශය.

2. ජානක අමරසිංහ මහතා, - සාමාජික
   ව්‍යාපෘති අධ්‍යක්ෂ,
   කුඩා තේ හා රබර් වතු පුණර්ජීවන ව්‍යාපෘතිය

3. තරංග නලින් ගම්ලත් මහතා - සාමාජික
   අධ්‍යක්ෂ,
   ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගළුම් ආයතනය.

4. එම්.පී.එල් නිල්මිණි මහත්මිය - ආරාධිත
   විගණන අධිකාරී
   ජාතික විගණන කාර්යාලය.

5. කේ.ඒ.ඩී. වසන්ත කුමාර මහතා - ලේකම්/කැඳවුම්කරු
   අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)
   ජාතික තරුණ සේවා සභාව

6. සී.කේ.හේරත් මහත්මිය
   නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)
   ජාතික තරුණ සේවා සභාව.

මූලාශ්‍රය - අභ්‍යන්තර විගණන අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම.

## 3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ විස්තරය

### 3.1 ජාතික තරුණ සේවා සභාවේ 2022/2023 වර්ෂයේ ප්‍රතිපාදන ලැබ්ම් පිළිබඳ විස්තර

| | | (රු 000) 2022 | (රු 000) 2023 |
|---|---|---|---|
| භාණ්ඩාගාර | | | |
| | පුනරාවර්තන | 1,174,969 | 1,325,050 |
| | ප්‍රාග්ධන | 81,914.60 | 566,764.98 |
| මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 1,256,883.60 | 1,891,814.98 |
| අමාත්‍යාංශ | | | |
| | පුනරාවර්තන | 39,591.19 | 6,000.00 |
| | ප්‍රාග්ධන | 110.51 | -- |
| මුළු අමාත්‍යාංශ ප්‍රතිපාදන | | 39,701.70 | 6,000.00 |
| පළාත් සභා | | | |
| | පුනරාවර්තන - | | |
| | ප්‍රාග්ධන - | | |
| විදේශ සංවිධාන | | | |
| | පුනරාවර්තන | 60,861.70 | 8,852.39 |
| | ප්‍රාග්ධන | - | - |
| විදේශ සංවිධාන ලැබීම් | | 60,861.7 | **8,852.39** |
| වෙනත් බාහිර ආයතන ලැබීම් | | | |
| | පුනරාවර්තන | 4,094.50 | 5,241.85 |
| | ප්‍රාග්ධන | 109.40 | 273.95 |
| වෙනත් බාහිර ආයතන ලැබීම් | | 4,203.90 | 5,515.80 |
| මුළු අමාත්‍යාංශ, බාහිර ආයතන, විදේශ සංවිධාන ලැබීම් | | 104,767.30 | 20,368.19 |
| | අභ්‍යන්තර ආදායම් | 230,558.53 | 250,227.69 |

## 3.2 ජාතික තරුණ සේවා සභාවේ 2023 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්


(රු 000)

| | | 2022 | 2023 |
|---|---|---|---|
| භාණ්ඩාගාර | | | |
| | පුනරාවර්තන<br>ප්‍රාග්ධන | 1,174,969 .00<br>81,914.60 | 1,325,050.00<br>566,764.98 |
| මුළු භාණ්ඩාගාර ගෙවීම් | | 1,256,884.00 | 1,891,814.98 |
| | | අමාත්‍යාංශ | |
| | පුනරාවර්තන<br>ප්‍රාග්ධන | 45,624.20<br>110.51 | 6,000.00<br>-- |
| මුළු අමාත්‍යාංශ ගෙවීම් | | 45,734.73 | 6,000.00 |
| පළාත් සභා | | | |
| | පුනරාවර්තන<br>ප්‍රාග්ධන | - | - |
| මුළු පළාත් සභා ගෙවීම් | | | - |
| විදේශ සංවිධාන | | | - |
| | පුනරාවර්තන<br>ප්‍රාග්ධන | 49,067.59<br>1,611.52 | 14,033.01<br>-- |
| මුළු විදේශ සංවිධාන ගෙවීම | | 50,679.11 | 14,033.01 |
| වෙනත් බාහිර ආයතන වැය | | | |
| | පුනරාවර්තන<br>ප්‍රාග්ධන | 2,207.80<br>109.41 | 4,768.40<br>273.95 |
| මුළු වෙනත් බාහිර ආයතන ගෙවීම් | | 2,317.21 | 5,042.35 |
| | | | |
| අභ්‍යන්තර ඉපැයීම් වැය | පුනරාවර්තන | 33,923.30 | 4,443.10 |
| | සංවර්ධන | 169372.70 | 229,817.82 |
| | ප්‍රාග්ධන | 210,367800. | 15,766.77 |
| | | 2,306,974.00 | 250,027.69 |

3.3 ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන)

**2016 – 2023 සංවර්ධන හා පරිපාලන වියදම් (රු.මි.)**

| වර්ෂය | 1<br>**2016** | 2<br>**2017** | 3<br>**2018** | 4<br>**2019** | 5<br>**2020** | 6<br>**2021** | 7<br>**2022** | 8<br>**2023** |
|---|---|---|---|---|---|---|---|---|
| සංවර්ධන | 768 | 1,212 | 1,115 | 575 | 427 | 488 | 488 | 644 |
| පරිපාලන | 1,014 | 1,075 | 1,124 | 1,309 | 1,223 | 1,240 | 1,239 | 1,329 |



## 3.4 සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය - 2023

| අවධාරිත ක්ෂේත්‍ර | | වැඩසටහන | වෙන් කල මුදල (රු.මි.) | | වැය කල මුදල (රු.මි.) | |
|---|---|---|---|---|---|---|
| | | | භාණ්ඩාගාර | අමාත්‍යාංශ | භාණ්ඩාගාර | අමාත්‍යාංශ |
| තරුණ තරුණියන් ජාලගත කිරීම හා අනාගතයට ගැලපෙන තරුණ පරපුරක් නිර්මාණය කිරීම | 1 | සෞන්දර්ය කුසලතා සංවර්ධන වැඩසටහන | 86.23 | | 58.75 | |
| | 2 | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | 179.00 | | 146.66 | |
| | 3 | තරුණ සංවිධාන හා තරුණ සංවර්ධනය | 54.60 | | 40.12 | |
| තරුණයන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය හා | 4 | රැකියා අභිමුඛ පාඨමාලා වැඩසටහන් | 182.00 | | 114.76 | |
| | 5 | විභාග හා ඇගයීම් වැඩසටහන් | 18.00 | | 19.59 | |
| | 6 | වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන සේවා වැඩසටහන් | 12.00 | | 4.79 | |
| තරුණ ව්‍යාපාර සංවර්ධනය | 7 | තරුණ ගොවිපොල සංවර්ධන වැඩසටහන | 109.20 | | 73.24 | |
| | 8 | තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 23.10 | | 19.51 | |
| අභ්‍යන්තර ධාරිතා සංවර්ධනය | 9 | පර්යේෂණ , කාර්යසාධන ඇගයීම් වැඩසටහන් | 19.65 | | 3.68 | |
| | 10 | මානව සම්පත් ධාරිතා සංවර්ධන වැඩසටහන් | 16.00 | | 17.98 | |
| ආයතනික ඩිජිටල්කරණය | 11 | තොරතුරු තාක්ෂණ වැඩසටහන් | 82.00 | | 4.82 | |
| | 12 | සමාජ මාධ්‍ය ප්‍රචාරණය හා ප්‍රවර්ධනය | 15.50 | | 4.99 | |
| ගෝලීය සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ තරුණයන් සවිබලගැන්වීම | 13 | ජාත්‍යන්තර තරුණ සබඳතා වැඩසටහන් | 15.00 | | 10.45 | |
| | 14 | යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහන් | 8.00 | | 1.17 | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 15 | ප්‍රාග්ධන භාණ්ඩ අත්පත්කර ගැනීම | 15.00 | | 11.97 | |
| | 16 | ඉදිකිරීම්, නඩත්තු හා අළුත්වැඩියා කිරීම. | 95.00 | | 34.23 | |
| තරුණ නායකත්ව කුසලතා සංවර්ධනය | 17 | තරුණ පාර්ලිමේන්තු වැඩසටහන | - | 42.00 | - | 6.00 |

## 4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2023

**2023 වර්ෂයේ දී තරුණ සංවර්ධනය ප්‍රධාන ක්ෂේත්‍ර 08 ක් ඔස්සේ වැඩසටහන් 17 ක් ක්‍රියාත්මක විය. එහි සාරාංශ හා විස්තරාත්මක සටහන පහත දැක්වේ.**

### 4.1 තරුණ සංවර්ධන ප්‍රගති සාරාංශය (2023.12.31 දිනට)

| අනු අංක | අවධාරිත ක්ෂේත්‍ර | වැඩසටහන | | වැඩසටහන් සංඛ්‍යාව | | සහභාගිත්වය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | ලගා කරගත් | ඉලක්කගත | ලගා කරගත් |
| 01 | තරුණ තරුණියන් ජාලගත කිරීම හා අනාගතයට ගැලපෙන තරුණ පරපුරක් නිර්මාණය කිරීම | I. | සෞන්දර්ය කුසලතා සංවර්ධන වැඩසටහන | 162 | 193 | 7178 | 7283 |
| | | II. | ක්‍රිඩා සංවර්ධන වැඩසටහන | 392 | 382 | 154,515 | 255,246 |
| | | III. | තරුණ සංවිධාන හා තරුණ සංවර්ධනය | 20,768 | 14,332 | 400,000 | 354,343 |
| 02 | තරුණයන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය හා | IV. | රැකියා අභිමුඛ පාඨමාලා වැඩසටහන් | 784 | 799 | 250,000 | 21,906 |
| | | V. | විභාග හා ඇගයීම් වැඩසටහන් | 306 | 348 | 42,200 | 20,756 |
| | | VI. | වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන සේවා වැඩසටහන් | 1049 | 888 | 100,000 | 72,589 |
| 03 | තරුණ ව්‍යාපාර සංවර්ධනය | VII. | තරුණ ගොවිපොල සංවර්ධන වැඩසටහන | 14 | - | - | - |
| | | VIII. | තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 112 | 35 | 2,775 | 1,774 |
| 04 | අභ්‍යන්තර ධාරිතා සංවර්ධනය | IX. | පර්යේෂණ , කාර්යසාධන ඇගයීම් වැ ඩසටහන් | 3 | - | - | - |
| | | **X.** | මානව සම්පත් ධාරිතා සංවර්ධන වැඩසටහන් | 70 | 48 | 1,400 | 1,569 |
| 05 | ආයතනික ඩිජිටල්කරණය | XI. | තොරතුරු තාක්ෂණ වැඩසටහන් | 3 | - | - | - |
| | | XII. | සමාජ මාධ්‍ය ප්‍රචාරණය හා ප්‍රවර්ධනය | 100 | - | - | - |
| 06 | ගෝලීය සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ වේ තරුණයන් සවිබලගැන්වීම | XIII. | ජාත්‍යන්තර තරුණ සබඳතා වැඩසටහන් | 23 | 24 | 68 | 1,611 |
| | | XIV. | යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහන් | 29 | 29 | 1,000 | 1,515 |
| 07 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | XV. | ප්‍රාග්ධන භාණ්ඩ අත්පත්කර ගැනිම. | 4 | - | - | - |
| | | **XVI.** | ඉදිකිරීම්, නඩත්තු හා අළුත්වැඩියා කිරීම් | 10 | - | - | - |
| 08 | තරුණ නායකත්ව කුසලතා සංවර්ධනය | XVII. | තරුණ පාර්ලිමේන්තු වැඩසටහන | 13 | 04 | 3,361 | 359 |

## 4.1 සෞන්දර්ය කුසලතා සංවර්ධනය

ඕනෑම සමාජයක යහපැවැත්ම වෙනුවෙන් කලාව සුවිශේෂී මෙහෙවරක් සිදුකරනු ලබයි. ශ්‍රී ලාංකික කලා කෙත පෝෂණය වෙනුවෙන් අංකුර කලාකරුවන්,නිර්මාණකරුවන් ජාතික තලයට හඳුන්වාදීම ජාතික තරුණ සේවා සභාවේ ප්‍රමුඛ කාර්යයකි. ඒ වෙනුවෙන් 2023 වර්ෂයේ පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

| අනු අංක | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව හා තරුණ සහභාගිත්වය | | මුළු තරුණ සහභාගිත්වය |
|---|---|---|---|---|
| I. | **ජාතික යෞවන සම්මාන තරගාවලිය හා උළෙල** | 01 | | 11,718 |
| II. | **ජාතික යොවුන් නාට්‍ය උළෙල** | 01 | | 953 |
| | ● දිගු නාට්‍ය (සිංහල හා දෙමළ ) නාට්‍ය 10 | | 782 | |
| | ● කෙටි නාට්‍ය 56 නාට්‍ය (සිංහල හා දෙමළ ) | | 171 | |
| III. | **ලලිත කලා ඩිප්ලෝමා පාඨමාලාව** | 01 | | 104 |
| | ● නර්තන | | 68 | |
| | ● සංගීත | | 36 | |
| IV. | **ජාතික සංස්කෘතික වැඩසටහන්** | 05 | | 8,570 |
| V. | ● ජාතික තෛපොන්ගල් වැඩසටහන | | 550 | |
| | ● වැලන්ටයින් ප්‍රසංගය | | 180 | |
| | ● තුරුණු පොසොන් කලාපය | | 7,000 | |
| | ● තම්බපණ්ණි සෞන්දර්ය චාරිකාව | | 320 | |
| | ● ජාතික සංහිදියා පාද යාත්‍රාවඋතුරු නැගෙනහිර සිට කතරගම ) (පූජා භූමිය දක්වා | | 420 | |
| VI. | **ලලිත කලා සංසද ( නර්තන - දිස්ත්‍රික්)** | | | 757 |
| VII. | **විශේෂ නර්තන කණ්ඩායම** | 01 | | 35 |

- **ජාතික යෞවන සම්මාන තරගාවලිය හා උළෙල**



නර්තන, සංගීත, සාහිත්‍ය කලා ඇතුළු විවිධ අංශ නියෝජනය කරමින් දිස්ත්‍රික්, පලාත් හා ජාතික මට්ටමින් යෞවන සම්මාන තරගාවලිය මෙවරත් පවත්වන ලදී. සිංහල, දෙමල, ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් තරග පැවැත් වූ අතර ආබාධිත පිරිස් සඳහා ද තරග ඉසව් සංවිධානය කරන ලදී. 2023 වසරේ 43 වන ජාතික යෞවන සම්මාන උළෙල උත්සවාකාරයෙන් මහරගම යොවුන් රගහලේ දී පවත්වන ලදී.

- **ජාතික යොවුන් නාට්‍ය උළෙල**



42 වන ජාතික යොවුන් නාට්‍ය උළෙලට සමගාමීව පළාත් තරග දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය සිංහල හා දෙමළ මාධ්‍ය නියෝජනය කරමින් පවත්වන්නට යෙදින. මෙහි අවසන් වටයේ නාට්‍ය ප්‍රදර්ශනය මරදාන එල්පින්ස්ටන් රඟහලේ දී පවත්වන ලදී.

- **ලලිත කලා ඩිප්ලෝමා පාඨමාලාව**



දිස්ත්‍රික් මට්ටමේ නර්තන හා සංගීත තරග 26 ක් මෙම වසරේ දී ක්‍රියත්මක වූ අතර එරමිණියාය, බෙල්වුඩ් හා මහරගම සෞන්දර්ය නිකේතනයන් හී ලලිත කලා ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක විය.

- **ජාතික සංස්කෘතික වැඩසටහන්**

විවිධ ජාතීන්ගේ සංස්කෘතික සාරධර්ම වත්මන් පරපුර වෙත හුවමාරු කිරීම ජාතීන් අතර අන්‍යෝන්‍ය සුහඳතාවය වර්ධනය කිරීම හා ආගමික සංහිඳියාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් ජාතික සංස්කෘතික වැඩසටහන් වසර පුරා ක්‍රියාත්මක විය.





## 4.2 ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා



- 2023.03.13 – 16 දින දක්වා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉන්දියාවේ ක්‍රියාත්මක කරන ලද (සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධතිය මගින් තිරසාර සංවර්ධන ඉලක්ක) Sustainable Development Goals by Research and Information System for Developing Countries වැඩසටහන සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී විය.
- 2023.07.03 සිට 17 දක්වා ඉතාලියේ පැවති "තරුණ රැකියා පිළිබඳ ඇකඩමිය" (ILO පුහුණු පාඨමාලාව) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාතික තරුණ සේවා සභාවේ නියෝජිතයෙක් සහභාගී විය.
- 2023.09.11 – 15 දින දක්වා ලන්ඩන්හි දී පැවැති **10th Commonwealth Youth Ministers' Meeting (10 CYMM)** වැඩසටහන සඳහා නියෝජිතයන් දෙදෙනෙකු සහභාගී විය.




- ජාත්‍යන්තර තරුණ දිනයට සමගාමීව 2023.08.12 දින රාජ්‍ය නොවන සංවිධාන සහ ජාතික තරුණ සේවා සභාව එක්ව වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.
- 2023.08.21 – 27 දින දක්වා රුසියාවේ පැවති VIII International Youth Forum " Eurasia Global " Orenburg, වැඩසටහන සඳහා නියෝජිතයෙක් සහභාගී විය.
- ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලය හා ජාතික තරුණ සේවා සභාව ඒකාබද්ධව 2023.11.11 දින Bon Odari Festival – 2023 වැඩසටහන පැවැත්වීය.
- 2023.11.30 සිට 2023.12.11 දක්වා ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවති දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ 28 වැනි සමුළුවට (COP 28) ශ්‍රී ලංකාව නියෝජනය කරමින්නියෝජිතයන් දෙදෙනෙකු සහභාගී විය.
- 2023 දෙසැම්බර් 04 වන දින රුසියාවේ පැවති International Forum of Civil Participation (ජාත්‍යන්තර සිවිල් සහභාගීත්වය පිළිබඳ) සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාතික තරුණ සේවා සභාවේ යොවුන් පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා සහභාගී විය.
- 2023.08.22 වන දින ගෝලීය තරුණ නායකත්ව වැඩසටහන ජපාන - ශ්‍රී ලංකා තරුණ තරුණියන් සමඟ ක්‍රියාත්මක කිරීම කෙරිණි.

- ශ්‍රී ලාංකික තරුණයින් සමඟ ඉන්දියාව/බංග්ලාදේශය/ මාලදිවයින/ මැලේසියාව යන රටවල තරුණ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් 2023.10.01 වන දින 16th Global Youth Peast Fest – 2023 වැඩසටහනට පැවැත්විය.
- 2023.12.04 – 11 දින දක්වා ඉන්දියා ශ්‍රී ලංකා තරුණ හුවමාරු වැඩසටහන පැවැත්විණි.
- දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සැලසුම් පිළිබඳ සාකච්ඡාවට අදාලව ( COP 27) ශ්‍රී ලංකාවේ ඊජිප්තු තානාපතිතුමා/ ශ්‍රී ලංකාවේ තරුණ කටයුතු අමාත්‍යතුමා හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන තරුණ සංවිධාන වල නියෝජිතයන් සමඟ මෙහෙයුම් කමිටු සාකච්ඡාවක් 2023.01.30 පැවැත්විය.




- 2023.02.04 වන දින AISEC සංවිධානයේ තරුණ තරුණියන් සහ Global Leader තරුණ කණ්ඩායම සමඟ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් විදේශගත රැකියා සඳහා යොමු කිරීමට අදාලව, බාහිර රැකියා ඒජන්සි සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, විදේශගත වීමට අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා බැංකු ණය පහසුකම් ලබාදීම සහ තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කිරීම.
- ජාතික තරුණ සේවා සභාව, ජයිකා ආයතනය සමඟ ඒකාබද්ධව මීරිගම පුහුණු මධ්‍යස්ථානය සඳහා ජපන් භාෂා පුහුණු උපදේශිකාවකගේ සේවය වසර 02 ක කාලයක් සඳහා ලැබිණි.




- ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලයේ පුහුණු මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක රූපලාවන්‍ය පාඨමාලාව සඳහා KOICA ආයතනය මගින් කොරියානු ස්වේච්ඡා සේවිකාවකගේ සේවය වසරක කාලයක් සඳහා ලබා ගැනීමට හැකිවිය. රු. ලක්ෂ 04 ක පමණ රූපලාවන්‍ය භාණ්ඩ KOICA ආයතනයේ අනුග්‍රාහක දායකත්වයෙන් තරුණ මධ්‍යස්ථාන පුහුණු අංශයට ලැබිණි.
- ජාතික තරුණ සේවා සභාව, ජයිකා ආයතනය සමඟ ඒකාබද්ධව ප්‍රධාන කාර්යාලයේ පුහුණු මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ පාඨමාලාවට සහ තරුණ සංවර්ධන කටයුතු වලට අදාලව යෞවන තිළිණ අංශය සඳහා ජපාන ස්වේච්ඡා සේවකයින් දෙදෙනෙකුගේ සේවය වසර 02 ක කාලයක් සඳහා ලබා ගැනීමට හැකිවිය.

## 4.3 තරුණ සංවිධාන හා සංවර්ධනය

ජාතික තරුණ සේවා සභාවේ තරුණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තරුණ පෙළ සංවිධාන ගත කිරීම, එසේ සංවිධානගත වූ තරුණ පෙළ සමඟ ඔවුන්ගේ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හරහා වඩා ඵලදායී ලෙස එම සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම මෙන්ම මෙරට ක්‍රියාත්මක තරුණ සංවිධානයන්ට සිය සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව සතු ශක්තීන් හා තාක්ෂණික සහයෝගය මගින් එම සංවිධාන බලගැන්වීම ප්‍රධානතම කාර්ය භාරය වේ. මෙරට තරුණ ප්‍රජාවේ නායකත්වය හා පෞරුෂ සංවර්ධනය, තරුණ සංවිධානයක් ලෙස යෞවන සමාජ ව්‍යාපාරයේ සංවර්ධනය, ඔවුන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රියව දායක කරගැනීම, රට තුළ වෙසෙන සියළුම ජාතීන් අතර සමඟිය හා මිත්‍රත්වය වැඩි දියුණු කිරීම වැනි අරමුණු ජයගැනීම පිණිස විවිධ වූ ව්‍යාපෘති වැඩසටහන් හරහා දායකත්වය සැපයීම ද සිදු කෙරේ.

- **තරුණ සංවිධාන පිහිටුවීම - 2023 වර්ෂය.**

**වර්ෂය තුළ යෞවන සමාජ සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ පිළිබඳ විස්තර.- 2023**

| අනු අං | ක්‍රියාකාරකම | සංඛ්‍යාව | සහභාගිත්වය |
|---|---|---|---|
| 1. | යෞවන සමාජ පිහිටුවීම | 13066 | 326023 |
| 2. | ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවීම | 329 | 23385 |
| 3. | දිස්ත්‍රික් මණ්ඩල පිහිටුවීම | 24 | 1829 |

| අනු අං | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය මණ්ඩල ප්‍රමාණය | සාමාජික සංඛ්‍යාව | සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1. | කොළඹ | 08 | 7,567 | 325 |
| 2. | කොළඹ 1 | 05 | 2,767 | 116 |
| 3. | ගම්පහ | 13 | 20,371 | 1,037 |
| 4. | කළුතර | 14 | 14,548 | 680 |
| 5. | ගාල්ල | 22 | 19,714 | 868 |
| 6. | මාතර | 16 | 13,648 | 645 |
| 7. | හම්බන්තොට | 12 | 11,675 | 553 |
| 8. | මහනුවර | 20 | 21,848 | 835 |
| 9. | මාතලේ | 11 | 8,981 | 453 |
| 10. | නුවරඑළිය | 05 | 13,927 | 474 |
| 11. | මොණරාගල | 11 | 6,624 | 275 |
| 12. | බදුල්ල | 15 | 17,092 | 616 |
| 13. | කෑගල්ල | 11 | 15,597 | 615 |
| 14. | රත්නපුර | 18 | 13,677 | 536 |
| 15. | කුරුණෑගල | 30 | 33,210 | 1,351 |
| 16. | පුත්තලම | 16 | 10,734 | 542 |
| 17. | අනුරාධපුරය | 22 | 16,163 | 701 |
| 18. | පොළොන්නරුව | 07 | 7,366 | 288 |
| 19. | ත්‍රිකුණාමලය | 11 | 7,913 | 192 |

| | | | | |
|---|---|---|---|---|
| 20. | මඩකලපුව | 14 | 21,932 | 534 |
| 21. | අම්පාර | 20 | 15,001 | 459 |
| 22. | වව්නියාව | 04 | 4,466 | 135 |
| 23. | මන්නාරම | 05 | 7,119 | 214 |
| 24. | කිලිනොච්චිය | 04 | 3,423 | 123 |
| 25. | මුලතිව් | 06 | 2,350 | 89 |
| 26. | යාපනය | 15 | 8,310 | 410 |
| | එකතුව | 335 | 326,023 | 326,023 |

- **තරුණ සංවිධාන සංවර්ධන වැඩසටහන් සාරාංශය - 2023**

| අනු අංක | දිනය | වැඩසටහන | පැවැත්වූ ස්ථානය | වැඩසටහන් ගණන | සහභාගීත්වය |
|---|---|---|---|---|---|
| 1. | - | යෞවන සමාජ පිහිටුවීම | සියළුම ග්‍රාම නිලධාරී වසම් තුළ | 13,066 | 326,023 |
| 2. | - | ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවීම | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ | 329 | 23,385 |
| 3. | - | දිස්ත්‍රික් මණ්ඩල පිහිටුවීම | සියළුම දිස්ත්‍රික්තුළ | 24 | 1,829 |
| 4. | 2023/2/01 | තෛපොංගල් සැමරුම | නාගරික තරුණයා දිස්ත්‍රික්කය | 01 | 300 |
| 5. | 2023/8/12 | ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම | මහරගම ප්‍රධාන කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථාන | 07 | 1,800 |
| 6. | 2023/9/01 | තරුණ කෘෂි ව්‍යවසායකයින් බලගැන්වීම | මහරගම ප්‍රධාන කාර්යාලය | 01 | 1,200 |
| 7. | 2023/11/05 | දේශගුණික විපර්යාස පිළිබඳ වැඩසටහන | වෝටර්ස් එජ් හෝටලය | 01 | 100 |
| 8. | 2023/8/28-30 | මත්නිවාරණ පුහුණු කරුවන් පුහුණු කිරීම | කලාවැව මිරිදිය ධීවර පුහුණු මධයස්ථානය | 02 | 102 |
| 9. | 2023/ සැප්තැම්බර් - දෙසැම්බර් | මත්නිවාරණය සම්බන්ධයෙන් පාසැල් යෞවන සමාජ නායකයින් දැනුවත් කිරීම | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ | 675 | 20,250 |
| 10. | 2023/සැප්තැම්බර් - දෙසැම්බර් | මත්නිවාරණ සමාජ මාධ්‍ය දැන්වීම් තරඟාවලිය | සියළුම දිස්ත්‍රික්තුළ | 23 | 2,325 |
| 11. | 2023/සැප්තැම්බර් - දෙසැම්බර් | ප්‍රාදේශීය මණ්ඩල සාමාජිකයන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | සියළුම දිස්ත්‍රික්කයන් තුළ | 102 | 5,530 |
| 12. | | | | | |

- **දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කල ස්වේච්ඡා වැඩසටහන් - 2023**

| සමාජ සංවර්ධන වැඩසටහන් | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | ආගමික සංවර්ධන වැඩසටහන් | සංස්කෘතික වැඩසටහන් | කෘෂිකාර්මික වැඩසටහන් | Clean & Green city Sri Lanka වැඩසටහන් | ජාතික ඒක්සත් සමගාමී වැඩසටහන් | පරිසර සංරක්ෂණ වැඩසටහන් | අන්‍යෝන්‍යාධාර උපකාරක වැඩසටහන් | නායකත්ව පුහුණු වැඩසටහන් | දේශීය තරුණ හුවමාරු වැඩසටහන් | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | වෙනත් වැඩසටහන් | මුළු වැඩසටහන් ප්‍රමාණය | සමස්ත වැඩසටහන්වල මූල්‍ය වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1166 | 561 | 1095 | 152 | 88 | 192 | 88 | 541 | 162 | 107 | 4 | 44 | 579 | 4777 | 188,958,982.00 |



## 4.4 ජාත්‍යන්තර යෞවන තිළිණ ප්‍රදාන වැඩසටහන



1956 වර්ෂයේ දී ආරම්භ කරන ලද එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන එංගලන්තයේ එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ පදනම මඟින් වර්ෂ 1980 දී ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 13-24 ත් අතර තරුණ කණ්ඩායම උදෙසා තරුණ සංවර්ධන වැඩසටහනක් ලෙස හඳුන්වා දෙන ලදී.



අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියෙන් විෂය සමගාමී වැඩසටහනක් ලෙස රජයේ පාසල් සිසුන් සඳහා හඳුන්වා දී ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන මඟින් තරුණ ප්‍රජාවගේ විවේක කාලය ඵලදායි ක්‍රියකාරකම්වල නිරත කිරීම තුලින් ඔවුන්ගේ මනෝභාවයන් සංවර්ධනය වීම මත පවතින සමාජ, ආර්ථික පරිසරයට යෝග්‍ය දේශීය හා විදේශීය අභියෝග ජයගත හැකි තරුණ තරුණියන් බිහි කිරීම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වෙයි.

මෙම ජාත්‍යන්තර තිළිණ වැඩසටහන හරහා ලෝකඩ, රජත සහ ස්වර්ණ වශයෙන් සහතික සහ පදක්කම් ලබා දෙනු ලබන අතර උක්ත සඳහන් තිළිණ අනුව පිළිවෙලින් සතියකට පැය 01 බැගින් පහත සඳහන්

ක්‍රියාකාරකම් ස්වේච්ඡා සේවය, ශාරීරික යෝග්‍යතා, කුසලතාවය අභියෝගාත්මක චාරිකා /ගවේෂණ මාස 06, මාස 12 සහ මාස 18 ක කාලයක් නොකඩවා සිදු කළ යුතුය.

මෙම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමෙන් පසුව එම ක්‍රියාකාරකම් ඇගයීමකට ලක්කර වාර්ෂිකව ලෝකඩ, රජත, ස්වර්ණ ලෙස ජාත්‍යන්තර තිළිණ හා සහතිකපත් ජාතික උත්සවයකදී ප්‍රදානය කරනු ලැබේ.

2023 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට අනුව පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

- එඩින්බරෝ තිළිණ ප්‍රදාන වැඩසටහන පිළිබඳව පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් හා විෂය සමගාමී නියෝජ්‍ය විදුහල්පති දැනුවත් කිරීම් 17 ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා සහභාගීත්වය 1259 කි.
- යෞවන තිළිණ පාසල් හෝ ආයතනවල ක්‍රියාත්මක කිරීම සඳහා ලියාපදිංචි කරන ලද තිළිණ නායක/නායිකාවන් පුහුණු කිරීමේ දෙදින වැඩමුළු 02ක් කොළඹ සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලදී පැවති අතර 84 දෙනෙකු සහභාගි විය.
- ජාතික පුහුණු මණ්ඩලය සඳහා එක් දින පුහුණු වැඩසටහනක් පැවැත් වූ අතර 20 දෙනෙකු සහභාගි විය.
- අභියෝගාත්මක ගවේෂණ පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන් 03 ක් පැවැත්වූ අතර 150 දෙනෙකු සහභාගි විය.
- අන්තර්ජාලගත වාර්තාකරණය පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කළ අතර ඒ සඳහා නියෝජිතයන් දෙදෙනෙකු (02) සහභාගි විය.
- ලියාපදිංචි කරන ලද තිළිණ අපේක්ෂක/ අපේක්ෂිකාවන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වූ අතර 56 දෙනෙකු සහභාගි විය.
- මීට අමතරව යෞවන තිළිණ ඒකක 21 ක ලෝකඩ, රජත සහ ස්වර්ණ අභියෝගාත්මක ගවේෂණ වැඩසටහන් සිසුන් 369 කගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදී.
- 2023 වාර්ෂික තිළිණ ප්‍රදානෝත්සවය සඳහා ලෝකඩ තිළිණලාභීන් 242 දෙනෙකු, රජත තිළිණලාභීන් 40 දෙනෙකු සහ ස්වර්ණ තිළිණලාභීන් 06 සුදුසුකම් සපුරන ලද අතර මුළු තිළිණලාභීන් සංඛ්‍යාව 288 දෙනෙකි.
- එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහනෙහි නේපාල ජාතික අධ්‍යක්ෂ දේව්රාජ් ගිමිරේ මහතා 2023.09.14 දින ජාතික යෞවන තිළිණ අංශයට සහභාගි විය.
- නව තිළිණ ඒකක 11 ක් ලියාපදිංචි කරන ලදී.

## 4.5 ක්‍රීඩා කුසලතා සංවර්ධනය

තරුණ ජවය, කණ්ඩායම් හැගීම, උද්යෝගය, කායික හා මානසික නිරෝගී භාවය පවත්වාගෙන යාම ක්‍රීඩාව තුළින් ජීවිතයට එකතු කර ගත හැකිය. නව යොවුන්විය හා සමඟම කිසියම් විශේෂිත ක්‍රිඩාවකට හෝ සමස්ත ක්‍රිඩාවට දක්වන ඇල්ම තුළ තරුණ තරුණියන්ගේ ජීවිතවලට ද කිසියම් පදනමක් එක්කර ගත හැකි වනු ඇත. සම කණ්ඩායම් අතර මෙන්ම සමාජීය වශයෙන් ද, ක්‍රීඩාව තුළින් ගොඩනැගෙන පෞරුෂත්වය පුද්ගලයෙකුගේ අනාගත දිශානතිය තීරණය වීම කෙරෙහි ක්‍රමික බලපෑමක් එල්ල කරනු ඇත. ජාතික තරුණ සේවා සභාව වාර්ෂිකව විවිධ ක්‍රීඩා ක්‍රියාකාරකම් සිදු කරනු ලබන අතර, ජාතික යෞවන ක්‍රීඩා තරගාවලිය හා උළෙල ශ්‍රී ලංකීය ක්‍රීඩා ත ක්ෂේත්‍රයෙහි නව තරග වාර්තා තුළින් ජාතික හා ජාත්‍යන්තර තළය වෙතයොමු වීමට මගපාදනු ලබයි. ඒ වෙනුවෙන්,

- **තිස් හතර (34 )වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල - 2023**

දිවයිනේ සියළුම යෞවන සමාජ ආවරණය වන පරිදි මළල ක්‍රීඩා තරඟ හා කණ්ඩායම් තරඟ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා තරඟාවලියද, එම ප්‍රාදේශීය තරඟ වලින් ජයග්‍රහනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දිස්ත්‍රික් යෞවන ක්‍රීඩා තරඟාවලියද, දිස්ත්‍රික් තරඟ වලින් ජයග්‍රහනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ජාතික යෞවන ක්‍රීඩා කණ්ඩායම් ක්‍රීඩා තරඟද,පවත්වනු ලැබේ. ඒ අනුව, 34 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල 2023 නොවැම්බර් මස 16,17,18,19 දිනයන්හි දී සුගතදාස ක්‍රීඩා සංකීර්ණයේදී සාර්ථකවන පවත්වා අවසන් කරන ලදි.




- **තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය - 2023**

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් පිළිගත් තරඟාවලියක් ලෙස තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය ක්‍රීඩක ක්‍රීඩිකාවන් 9,500 ගේ සහභාගිත්වෙයෙන් 2023 - වර්ෂයේදී ද පවත්වන ලදි. දිස්ත්‍රික් තරඟ දිස්ත්‍රික ආශ්‍රිතව ද අවසන් පූර්ව තරඟ හා අවසන් තරඟ මහරගම ජාතික තරුණ මධ්‍යස්ථාන ගෘහස්ත ක්‍රීඩාංගනයේ දී 2023 දෙසැම්බර් මස 23 දින පැවැත්වීමට කටයුතු කරනු ලැබිණි.




ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ජාතික තරුණ සේවා සභාව සුවිශේෂී මෙහෙවරක් ඉටු කරනු ලබයි. මෙම ක්‍රීඩාවට අවශ්‍යය ක්‍රීඩකයින් පුහුණු කිරීම සඳහා විශේෂ ක්‍රීඩා පුහුණු පාසලක් හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිතව ක්‍රිත්මකවන අතර මෙම වසර තුළ ක්‍රීඩකයන් 15 දෙනෙකු පුහුණුව ලබමින් සිටී.

## 4.6 කාර්මික හා වෘත්තීය පුහුණු වැඩසටහන

වේගවත් ගෝලීයකරණ ක්‍රියාවලියෙහි වඩා සාපේක්ෂ වාසි ලබාගත හැකි වන්නේ රටක් සතුව පවතින නිපුණ ශ්‍රම බලකාය මගිනි. රටක නිපුණ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට වෘත්තීය පුහුණුව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. විශේෂයෙන් මෙරට තරුණ ශ්‍රම බලකාය නිර්මාණය කිරීම කෙරෙහි කේන්ද්‍රියව බලපාන පිරිස වන්නේ තරුණ ප්‍රජාව වේ. එම නිසා ඔවුහු පුහුණු කිරීම ඉතා වැදගත් අංගයකි. ශ්‍රී ලංකාව තුළ වර්ෂිකව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ) හා (උ.පෙළ) විභාගයෙන් උසස් අධ්‍යාපනයෙන් විශාල තරුණ පිරිසක් ශ්‍රම බලකායට එකතුවේ.

ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි ගොවිපළ පුහුණු මධ්‍යස්ථාන , සෞන්දර්ය නිකේතන, ඇතුළු වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 56 මේ වන විට ක්‍රියාත්මක වේ. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) ලත් පුහුණු අභ්‍යාසලාභීන් බිහිකිරීම මෙම පුහුණු මධ්‍යස්ථාන තුළින් සිදු කෙරේ. පූර්ණ හා අර්ධ කාලීන ලෙස ක්‍රියාත්මක පාඨමාලා සඳහා මෙම වසරෙහි සිසුන් **21,185** දෙනෙකු පාඨමාලා හදාරා පිටව ගොස් ඇත.

<u>පුහුණු මධ්‍යස්ථාන තොරතුරු</u>

- ❖ පුහුණු මධ්‍යස්ථාන ප්‍රමාණය - 56
- ❖ පාඨමාලා ප්‍රමාණය - 108
  (පූර්ණ - 43 , අර්ධ කාලීන – 65 )
- ❖ පාඨමාලා සම්පූර්ණ කල අභ්‍යාසලාභීන් ප්‍රමාණය - **21,185**
- ❖ NVQ මට්ටම් - III, IV , V
- ❖ පාඨමාලා කාලය - මාස 06, අවුරුදු 01, අවුරුදු 02

| වෘත්තීය පුහුණු පාඨමාලා | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පාඨමාලා ගණන | පාඨමාලා සඳහා බඳවා ගැනීම | | | | මුලාය ප්‍රතිපාදන | | වියදම රු. මි (000) | |
| පූර්ණ කාලීන | අර්ධ කාලීන | බඳවාගත් ගණන | අවසන් කල ගණන | හැර ගිය ගණන | ප්‍රාග්ධන | පාඨමාලා ආදායම | ප්‍රාග්ධන | පුනරාවර්තන |
| 32 | 60 | 22,304 | 21,185 | 1,119 | 61,223 | 290.96 | 207.4 | 472.00 |

## 4.7 විභාග හා ඇගයීම්

- ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන 58 ක පවත්වනු ලබන NVQ සහ Non NVQ පාඨමාලා සඳහා විධිමත් ලෙස අවසන් පරීක්ෂණ පවත්වා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිලිගත හැකි සහතිකපත් ප්‍රදානය කිරීම.




- ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන නිපුණතා නොවන (Non NVQ) පාඨමාලා සඳහා Online විභාග පද්ධතිය මගින් විභාග පවත්වා දෙමසක් ගත වීමට පෙර විභාග ප්‍රතිඵල මධ්‍යස්ථාන වෙත නිකුත් කිරීම සහ සමත් වූ අභ්‍යාසලාභීන් සඳහා නව සහතිකපතක් නිකුත් කිරීම.

- ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන නිපුණතා පාදක (NVQ) පාඨමාලා සඳහා ඇගයීම් පවත්වා ජාතික හා ජාත්‍යයන්තරව පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහිත NVQ සහතිකපත් BMICH හි සහතික ප්‍රදානෝත්සවයක් පවත්වා පුහුණු අභ්‍යාසලාභීන් හට ලබා දීම.



ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ විස්තරය - 2023

| අනු අංක | වැඩසටහනේ නම | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | Non NVQ පාඨමාලා අවසන් විභාග පැවැත්වීම අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | 5655 |
| 2. | Non NVQ සහතිකපත් නිකුත් කිරීම | 5211 |
| 3. | NVQ ඇගයීම් කටයුතු සිදුකිරීම සහතිකපත් නිකුත් කිරීම | 8661 |
| 4. | NVQ සහතිකපත් නිකුත් කිරීම | 6134 |
| 5. | සෞන්දර්ය පාඨමාලා විභාග පැවැත්වීම | 14 |
| 6. | විෂය නිර්දේශ සකස් කිරීම<br>අදාල විෂය නිර්දේශයන් වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන පරිදි සකස් කිරීම සිදු කරන ලදී.<br>• Diploma in 3D Animation & VFX<br>• Diploma in Computer Studies (DCS)<br>• Diploma in Multimedia Designer<br>• Diploma in Computer Hardware With Network Administration | |





## 4.8 තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය

තරුණ තරුණියන් ව්‍යවසායකයන් ලෙස බිහිකිරීමට කිරීමට අපේක්ෂිත තරුණ පිරිස් අරමුණු කරගෙන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපාරයක හෝ ස්වයං රැකියාවක නියැලී සිටින හෝ ඉදිරියේදී ව්‍යවසායකයෙක් ලෙස කටයුතු කිරීමට අපේක්ෂිත තරුණ තරුණියන් ඉලක්ක කණ්ඩායම වේ. ඔවුන්ට අවශ්‍යය ව්‍යවසාය ක්ෂේත්‍රයහි දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම වෙනුවෙන් පහත විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 2023 වසරේ ක්‍රියාත්මක කරනු ලැබිණි.

- ව්‍යාපාර පවත්වා ගෙන යාමට අවශ්‍ය කළමනාකරණ පුහුණුව ලබා දීම.
- © ව්‍යාපාර ගැටලු හඳුනාගෙන එම ගැටලු ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.
- ස්වයං රැකියා වෘත්තීය පුහුණුව ලබාගත් තරුණ තරුණියන්ට ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම.
- මූල්‍ය ආයතන වෙතින් අවශ්‍ය සහන ලබා ගැනීමට මග පෙන්වීම ආර්ථික ක්‍රමයට තරුණ තරුණ යොමු කිරීම.
- අවදානම් දරමින් තම ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීම.
- තම නිෂ්පාදන ගුණාත්මක හා ඵලදායි අයුරින් ලබාදීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.
- දේශීය හා ජාත්‍යන්තර වෙළඳ පොළට ගැලපෙන ව්‍යාපාර දියුණු කර ගැනීමට සහාය දීම
- අන්තර්ජාලය හරහා තම නිවසේ සිටම ආදායම් උත්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට හැකිවීම.
- අන්තර්ජාලය සමඟ ගනුදෙනු කිරීමේ දී අවශ්‍යය කරන දේශීය හා ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලැබීම.
- වර්තමානයේ රජය මුහුණ පා සිටින රැකියා අර්බුදයට මෙමගින් විසඳුමක් සෙවීම.

## 4.9 තරුණ කෘෂි සංවර්ධනය



ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස ජාතික අවශ්‍යතාවයන්ට සරිලන අයුරින් තරුණ තරුණියන් සම්ප්‍රදායික අත්දැකීම් තුළින්, නවීන තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ,කෘෂිකර්මාන්තය වෙත යොමු වීමට වැඩි නැඹුරුවක් ඇතිකිරීම වෙනුවෙන් විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් ජාතික තරුණ සේවා සභාව ගොවිපළ මධ්‍යස්ථාන 21 තුළ ක්‍රියාත්මක කරනු ලබයි. මෙම මධ්‍යස්ථාන තුළ පැළ තවාන් සංවර්ධන සහායක කෘෂි ක්ෂේත්‍ර සහායක පාඨමාලා ක්‍රියාත්මක අතර, අර්ධ වාර්ෂික න්‍යායාත්මක දැනුම ද ඉන් අනතුරුව මාස හයක වැඩිදුර ප්‍රායෝගික පුහුණුව ද තරුණ තරුණියන්ට ලබාදීමට කටයුතු කෙරේ. එයට අමතරව පහත දැක්වෙන වැඩසටහන් ද 2023 වසර තුළ ක්‍රියාත්මක කර ඇත.

**ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් - 2023**

| අනු අං | වැඩසටහන/ ව්‍යාපෘතිය/ | වැඩසටහන් සංඛ්‍යාව | මුළු තරුණ සහභාගිත්වය |
|---|---|---|---|
| I. | තරුණ ගොවිපල මධ්‍යස්ථාන සංවර්ධනය | 22 | 300 |
| II. | තරුණ කෘෂි ව්‍යවසායක කෘෂි අලෙවි ප්‍රදර්ශණය | කුටි -107 | 1500 |
| III. | කෘෂි සමාගම්හි තරුණ කෘෂි ව්‍යවසායක පුහුණුව | 01 | 167 |
| IV. | මධ්‍යස්ථානභාර නිලධාරින් හා කෘෂි උපදේශක පුහුණුව | 03 | 101 |
| V. | ගෙවතු වගාව හා කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ තරුණ කෘෂි ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ පුහුණු සැසි | 25 | 750 |
| VI. | සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කබානා ලබාදීම | 01 | - |
| VII. | ගොවිපල ඉඩම් ඩ්‍රෝන තාක්ෂණය මඟින් මැනීම | 20 | 20 |
| VIII. | නිෂ්පාදන අගය එකතු කිරීම හා ආහාර විජලන පුහුණුව | 09 | 540 |
| IX. | Smart Agro Youth Institute දක්වා වර්ධනය සඳහා ව්‍යාපාරික සැලැස්මක් සකස් කිරීමේ වැඩමුළුව | වැඩමුළු01 | 50 |

## 4.10 මාධ්‍ය ප්‍රචාරණය

ජාතික තරුණ සේවා සභාව මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සඳහා වඩාත් පුළුල් ප්‍රචාරණයක් ලබාදීම වෙනුවෙන් සියලු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආවරණය කරමින් , ප්‍රජාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීම මාධ්‍ය අංශයේ වගකීම විය.

- ගුවන් විදුලිය ,රූපවාහිනිය පුවත්පත් සමාජ මාධ්‍ය ජාලා තුළ කාලීන වැඩසටහන් පිළිබඳ තොරතුරු ප්‍රවෘත්ති හා දැනුවත්කිරීම් වසර පුරා සිදුකොට ඇත.

## 4.11 නිස්කෝ වීඩියෝ

තරඟකාරී වාණිජ ලෝකයේ නොයෙකුත් අපහසුකම් නිසා සිය දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට නොහැකි ශ්‍රී ලාංකික තාරුණ්‍යයට සුදුසු පරිසරයක් ගොඩනැගීම සඳහා ජාතික තරුණ සේවා සභාව විසින් නිස්කො වීඩියෝ අංශය ආරම්භ කරන ලදි.

විද්‍යුත් හා සමාජ මාධ්‍ය තුළින් **Sri Lanka Youth** ප්‍රතිරූපය සමාජගත කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදනය හා සිනමාව සම්බන්ධව උනන්දුවක් දක්වන තරුණ තරුණියන් සඳහා දැනුම, ආකල්ප හා කුසලතා වලින් සන්නද්ධ කිරීම, ඔවුන්ගේ නිර්මාණ ජාතික තලයට

රැගෙන යාමට අවශ්‍ය පරිසරය සැකසීම ප්‍රධාන කාර්යයන් වේ.

## 4.12 පර්යේෂණ,සැලසුම් හා ප්‍රගති සමාලෝචනය





ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම තුළින් රටේ තාරුණ්‍යයේ අවශ්‍යතා අනුව ආයතනික කටයුතු විධිමත්ව සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම තුළින් ආයතනික කාර්යසාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

සංයුක්ත සැළැස්ම සකස් කිරීම, වාර්ෂික සංවර්ධන සැළැස්ම , වාර්ෂික ක්‍රියාත්මක සැළැස්ම සැකසීම, කාර්යසාධන හා වාර්ෂික වාර්තා සකස් කිරීම, වාර්ෂික ක්‍රියාත්මක සැළැස්ම අනුව ප්‍රගතිය මාසික කාර්තු හා වාර්ෂික ප්‍රගතිය සැකසීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම, ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම.(Monitering & Evaluation) සිදුකෙරේ.

තවද, විවිධ ක්ෂේත්‍රයන් හී කාලීනව සිදුවන වෙනස්කම් මත හට ගන්නා තරුණ අවශ්‍යතා හඳුනා ගැනිම වෙනුවෙන් පර්යේෂණ සිදු කරයි.

එමෙන්ම, පාඨමාලා හදාරන අභ්‍යාසලාභීන් හා කාර්ය මණ්ඩලයේ කාලීන තොරතුරු හා දැනුම වර්ධනය, වෙනුවෙන් පුස්තකාලය පවත්වා ගෙන යාම හා එහි සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි.

## 4.13 තොරතුරු තාක්ෂණ සංවර්ධනය

ජාතික තරුණ සේවා සභාවේ සියලුම තොරතුරු තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම අරමුණවේ වේ.

I. ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාකාරකම් නවීන තාක්ෂණය භාවිතා කර ඉටු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සංවර්ධනය කිරීම.

II. කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයක් සැකසීම මගින් ශ්‍රී ලාංකීය තාරුණ්‍යය වෙත තොරතුරු සන්නිවේදනය කාර්යක්ෂම කිරීම.

III. ජාතික තරුණ සේවා සභාවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය හා යාවත්කාලින කිරීම තුලින් තොරතුරු ඉක්මනින් ලබා දීම.

IV. ජාතික තරුණ සේවා සභාවේ පවතින පරිගණක ජාල පද්ධතිය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම හා යාවත්කාලින කිරීම.

V. ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ /පුහුණු මධ්‍යස්ථාන තරුණ තරුණියන්ගේ තොරතුරු තාක්ෂණ භාවිතය හා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.

⊗ **2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

I. කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කොට පවත්වා ගෙන යාම සිදු කරන අතර ඒ සඳහා සියළු පුහුණු මධයස්ථාන වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා එයට දත්ත ඇතුලත් කරමින් ක්‍රියාත්මක මට්ටමේ පවත්වා ගෙන යාම.

II. වෙබ් අඩවිය නිර්මාණය කිරීම ජාතික තරුණ සේවා සභාව තුල ක්‍රියාත්මක වු වෙබ් අඩවිය නවිකරණය කිරීම හා පවත්වා ගෙන යාම සිදු කෙරේ.

## 4.14 වෘත්තීය මාර්ගෝපදේශන, උපදේශන හා පුහුණු වැඩසටහන





කිසියම් වෘත්තියක් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටුකිරීම වෙනුවෙන් තරුණ තරුණියන්ගේ ශක්තීන් හා විභවතා හඳුනාගෙන අදාළ අංශ වෙත යොමු කිරීම, තරුණ වෘත්තීය මාර්ගෝපදේශනය මගින් සිදුකෙරේ. විශේෂයෙන් ගෝලීය ශ්‍රම වෙළඳපොළ හා අනාගත වැඩ ලෝකය හා සැසඳෙන පරිදි තරුණයන් වෙත වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම දිස්ත්‍රික් මට්ටමින් සිදුකරනු ලබයි. තරුණ තරුණියන්ගේ ආකල්ප ඔවුන්ගේ හැසිරීම් රටා විභවතාවන් පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේද අනුව තක්සේරු කිරීම වෙනුවෙන් වෘත්තීය ලැදියා පරික්ෂණය (මනෝමිතික පරික්ෂණ) පැවැත්වේ. එය පුහුණුවලත් කාර්ය මණ්ඩල විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2023 වසරේදී ද ඉලක්කගත කණ්ඩාම් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.සමාජ, ආර්ථික, දේශපාලනික,සංස්කෘතික හෝ වෙනත් සමාජානුයෝජන පුද්ගල හෝ ආයතනික සාධක හේතු කොට ගෙන තරුණයාට ස්වයංව විසදුම් සොයා ගැනීමට අපොහොසත් මනෝ මූලික ගැටළු විසදා ගැනීම සඳහා තරුණ උපදේශන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

**වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම්**

| අනු අං | වැඩසටහන /ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිත්වය |
|---|---|---|---|
| **වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්** | | | |
| I. | පාසැල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන | 342 | 23813 |
| II. | පාසල් හැර ගිය සිසුන් සඳහා වෘත්තීය | 246 | 15904 |
| III. | පුහුණු අභ්‍යාසලාභීන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන | 130 | 8292 |
| IV. | ග්‍රාමීය යෞවනත්වයට වෘත්තීය නව මඟක් | 11 | 447 |
| V. | රැකියා ආයතන හමුව | 7 | 300 |
| **එකතුව** | | **736** | **48756** |
| **උපදේශන වැඩසටහන්** | | | |
| I. | පුහුණු අභ්‍යාසලභීන් හා දෙමාපියන් අභිප්‍රේරණය | 20 | 1169 |
| II. | සුන්දර යෞවනත්වය රැක ගනිමු. | 04 | 264 |
| III. | මානසික සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන | 13 | 572 |
| IV. | “සතිමත් වෙමු“ විශේෂ උපදේශන වැඩසටහන | 12 | 926 |
| **එකතුව** | | **49** | **2931** |

## 4.15 විශේෂ ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ කාලීන, ආර්ථික, සමාජයීය,දේශපාලන, සංස්කෘතික හා පාරිසරික තත්ත්වයන් පිළිබඳ

වඩාත් සංවේදී වන හා එම ක්ෂේත්‍රයන්හි විෂය දැනුමින් පෝෂිත අනාගත දේශපාලන භූමිකා නියෝජනය සඳහා සුදුසු මානව හිතවාදී ශ්‍රී ලාංකේය තරුණ නායකයන් බිහිකිරීම,රටේ සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා ඔවුන්ගේ අදහස් හා මතවාද නියෝජනය කිරීමට අවස්ථාව ලබාදීම, විවිධ සමාජ වැඩ පරිචය මඟින් සැබෑ ක්‍රියාකාරකයෙකු , විපර්යාසකාරකයෙකු සහ ස්වේච්ඡා නායකයෙකු ලෙස ගොඩනැංවීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- **ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු වැඩසටහන**



**පාර්ලිමේන්තුවේ සංයුතිය**

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පැවැත්වූ මැතිවරණයෙන් | - | 331 |
| විශ්ව විද්‍යාල මට්ටමින් පැවැත්වූ මැතිවරණයෙන් | - | 29 |
| | | 360 |

**ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු සැසිවාර පැවැත්වීම**

| | | |
|---|---|---|
| පැවැත්වූ දිනයන් | - | 2023.06.17 හා 18 දෙදින |
| පැවැත්වූ ස්ථානය | - | පැරණි පාර්ලිමේන්තු සභා ගර්භයේදී |
| සහභාගීත්වය | - | 208 |
| පැවැත්වූ දිනයන් | - | 2023.10.28 හා 29 දෙදින |
| පැවැත්වූ ස්ථානය | - | පැරණි පාර්ලිමේන්තු සභා ගර්භයේදී |
| විවාද මාතෘකාව | - | අයවැය පිළිබඳ තාරුණ්‍යයේ මත හා යෝජනා (2023.10.28 දින) |
| පැවැත්වූ දිනයන් | - | 2023.11.18 හා 19 දෙදින |
| පැවැත්වූ ස්ථානය | - | පැරණි පාර්ලිමේන්තු සභා ගර්භයේදී |
| සහභාගීත්වය | - | 88 |



තරුණ පාර්ලිමේන්තු නියෝජිතයින්, යෞවන සමාජ සම්මේලන තරුණ නායකයින් හා වෙනත් තරුණ සංවිධාන තරුණ තරුණියන් වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## 4.16 කාර්ය සාධන , ඇගයීම් හා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන



සිං සහ අන් අයට (1990) අනුව, "යම් නිශ්චිත රැකියාවක් හෝ කාර්යයක් ඉටුකිරීමට පෞරුෂය බිහිකිරීම සඳහා අවශ්‍යය වන්නා වූ දැනුම, කුසලතාවය, ආකල්ප සංවර්ධනය කිරීම පුහුණුවයි". කිසියම් ස්ථානයක කලින් සැලසුම් කල විෂය නිර්දේශ / මොඩියුල, කාලරාමුවක්, සැසි සැලැස්මක් සකස් කර පුහුණු උපකරණ (ශ්‍රව්‍ය, දෘශ්‍ය) සහිතව හෝ රහිතව ප්‍රායෝගිකව, න්‍යායාත්මකව හෝ දෙඅංශයයෙන්ම ඉළක්කගත කණ්ඩායමක් හෝ පුද්ගලයෙකු වෙත දැනුම ලබාදීම විධිමත් පුහුණු මඟින් සිදුකෙරේ." ඕපාත (1995,පි.210)



ඕනෑම ආයතනයක/සංවිධානයක සේවකයන් එකම රැකියාව තුළ කාලයක් නිරත වීම නිසා ආයතනය සේවකයාගෙන් බලාපොරොත්තු වන රාජකාරී වගකීම් මෙන්ම යුතුකම් ද ,නිසි පරිදි, ක්‍රමානුකූලව, අඛණ්ඩව සිදුනොවේ. එහි ප්‍රතිඵලය වන්නේ ආයතනය, සේවකයාගෙන් අපේක්ෂා කරන ප්‍රමිතිගත සැබෑ කාර්යඵලය නොලැබීමයි. එවැනි අවස්ථා වලදී ආයතනික කළමනාකාරිත්වය මානව සම්පත් කළමනාකරණ මූලධර්ම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර අවශ්‍යය විසඳුම් ගනු ලබයි.

විශේෂයෙන් එවැනි අවස්ථාවලදී සේවකයාගේ හීනවමින් යන රැකියාවට අවශ්‍යය දැනුම, කුසලතා මෙන්ම ආකල්ප වැඩිදියුණු කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පුහුණුව හා සංවර්ධනයට අවශ්‍යය උපායමාර්ගික සැලසුම් දියත් කරනු ලබයි. එවිට සේවකයාගේ විභවතාවයන් ස්මතු වී නැවත සේවකයාගේ කාර්යක්ෂමතාවය ඉහළයාම සිදුවේ. එමගින් ආයතකික සඵලදායිත්වය ඉහළ යනු ලැබේ. සේවක අභිප්‍රේරණ ක්‍රියාවලිය එම කාර්යය වඩාත් ජවසම්පන්න කරනු ලබයි.

විශේෂයෙන් ජාතික තරුණ සේවා සභාවේ සේවකයන් සඳහා නිරන්තරයෙන් පුහුණුව අවශ්‍යය වේ. තරුණ අවශ්‍යතා ඉතා කෙටිකාලීනව වෙනස්වීම නිසා එම වෙනස්වන තරුණ අවශ්‍යතාවයන් නිසි ලෙස තෘප්ත කිරීමට නම් තරුණ සේවා සපයන්නන්(නිලධාරීන්/සේවකයන්) නිරන්රයෙන් යාවත්කාලීන කලයුතුවේ. අනෙක් අතින් මෙරට තරුණ තරුණියන්ගේ සංවර්ධන කටයුතු ඉටු කිරීමේ දී ඔවුන්ගේ සංවර්ධනය සඳහා වෙන් කර ඇති සෑම භෞතික ,මානව හා මූල්‍ය සම්පතක්ම උපරිම කාර්යක්ෂමතාවයකින් හා

වලදායිත්වයකින් යොදවා ගැනීම ජාතික තරුණ සේවා සභාවේ ප්‍රමුඛ පරමාර්ථයක් වන අතර ඒ සඳහා සේවක පුහුණුව,සංවර්ධනය හා අභිප්‍රේරණය අත්‍යාවශ්‍ය අංගයකි. විශේෂයෙන් මෙරට තරුණ සංවර්ධන කාර්යය ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ඉහළ නැංවීමට නම් තරුණ සංවර්ධන කාර්යයට අවශ්‍යය සේවා සපයන්නන්ගේ දැනුම කුසලතා මෙන්ම ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා සැලසුම්ගත පුහුණු ක්‍රියාවලියකට යොමු කල යුතුවේ. පුහුණුව හා සංවර්ධනය අකර්මන්‍ය වූ කල් හී ආයතනික කාර්යක්ෂමතාවය හා වලදායිත්වය හීනවෙමින් පවතින බව මානව කළමනාකරණ විද්වතුන්ගේ මතයයි. එමනිසා, ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන පරමාර්ථය වන තරුණ සංවර්ධන කාර්ය වඩාත් ප්‍රමිතිගතවත්, වෘත්තීයභාවයෙන් යුක්තවත් සඵලදායිව තරුණයා හට ලබාදීමට විවිධ කළමනාකාරිත්ව මට්ටම් වල සේවකයන් පුහුණු කරනු ලැබේ.

| අනු අංක | වැඩසටහනේ නම | නිමැවුම / ලබාගත් දැනුම | කාල සීමාව | පුහුණු වූ සංඛ්‍යාව | සමස්ත වැය (Rs Mn) |
|---|---|---|---|---|---|
| I. | කළමනාකරණ සහකාර වරුන් සඳහා විධිමත් රාජකාරී ලිපිගොනු පවත්වාගෙන යාම පිළිබඳව පුහුණු වැඩ සටහන් තුනක් පැවැත්විණි. | රාජකාරි ලිපි ගොනු විධිමත් කිරීම | 2023.02.10<br>2023.02.23<br>2023.02.28 | 64<br>දේශීය | -- |
| II. | ප්‍රාථමික ශිල්පීය දායකත්වය නොඅඩුව ලබා දීම උදෙසා “කාර්යාල කාර්ය සහායක සහ බහුකාර්ය සංවර්ධන සහායකයන් සඳහා පුහුණු වැඩ සටහන් දෙකක් පවත්වන ලදී. | ආයතනික වලදායිත්වය හා කාර්යක්ෂමතාවය ඉහළනැංවීම | 2023.03.30<br><br>2023.03.30 | 25<br>දේශීය | -- |
| III. | මාණ්ඩලික නිලධාරීන් සඳහා නායකත්ව කුසලතා වර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්විණි. | නායකත්ව කුසලතාවය වර්ධනය කිරීම | 2023.04.05<br>2023.04.06<br>2023.04.07 | 128දේශීය | 0.3 |
| IV. | තරුණ සේවා සභාවේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩ සටහන් | මානව සම්පත් කළමනාකරණය හා පිරිස් පාලනය | 2023.05.24,25,30,31 | 356දේශීය | 0.33 |
| V. | තරුණ සේවා සභාවේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩ සටහන | මානව සම්පත් කළමනාකරණය හා පිරිස් පාලනය | 2023.ජුනි 01,06,08,09,15, 20,23,28,30 | 480 | 0.69 |
| VI. | සම්පත් කළමනාකරණය පිළිබඳ එක් දින වැඩ මුළුවක් පැවැත්වීම. | සම්පත් කළමනාකරණය හා පිරිස් පාලනය | 2023.07.13 | 25<br>දේශීය | |

.

| | | | | | |
|---|---|---|---|---|---|
| **VII.** | සහකාර තරුණ සේවා . නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන් දෙකක් පැවැත්විණි | ධාරිතා සංවර්ධනය | 23-2023.07.21<br><br>30-2023.07.28 | 207 දේශීය | 1.25 |
| VIII. | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් සඳහා එක් දින පුහුණු වැඩ මුළුවක් පවත්වන ලදී. | කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය | 2023.07.21 | 25 **දේශීය** | - |
| IX. | තරුණ සේවා නිලධාරීන් සඳහා පැවැත් වූ දින දෙකක පුහුණු වැඩ මුළුව | ධාරිතා සංවර්ධනය | 2023.07.27,28 | 63 **දේශීය** | - |
| X. | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී සඳහා නේවාසික දෙදින පුහුණු වැඩමුළුව | සේවාලාභීන්ගේ ගැටළු හදුනාගැනීම | 12 -2023.09.11 | 28 දේශීය | 0.04 |
| XI. | ගොවිපොළ හා කෘෂි පුහුණුවීම් වල යෙදෙන නිලධාරීන් සඳහා තෙදින පුහුණු වැඩ මුළුව | ගොවිපල කළමනාකරණය පිළිබඳ පුහුණුව | 2023.09.15<br>18 - | 59 දේශීය | 0.68 |
| XII. | නැගෙනහිර පළාත් කාර්ය මණ්ඩල ධාරිතා පුහුණු වැඩමුළුව . | කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය | 2023.10.10-12 | 44 දේශීය | 0.62 |
| XIII. | ගොවිපල සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩ මුළුව . | දස දහසක් විසඳුම් සොයන හා ගොවිපල සංවර්ධනය පිළිබඳ පුහුණුව | 2023.10.27-29 | 36 දේශීය | 0.30 |
| XIV. | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් සඳහා  පුහුණු වැඩමුළුව | පදනම් ආයතනයේ පවත්වන ලද HIV පුහුණු වැඩමුළු | 2023.10.18-19 | 29 දේශීය | -- |
| XV. | SMART ගොවිපල ව්‍යාපාරික සැලැස්ම සකස් කිරීම වැඩ සටහන | සම්පත් කළමනාකරණය හා පිරිස් පාලනය | 2023.12.15- 17 | 34 **දේශීය** | 0.32 |
| XVI. | අධ්‍යයන ගාස්තු ගෙවීම | විෂයානුබද්ධ දැනුම | 2.023.01.01<br>2023.12.31 | 23 **දේශීය** | 0.214 |
| සමස්ත පුහුණු වැඩසටහන | | ආයතනික කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනයවීම | වසර පුරා | **1626** | **0.668** |

## 05. පාලන හා මානව සම්පත් කළමනාකරණය

### 5.1 ආයතනික කටයුතු

1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම පිණිස අවශ්‍ය වන සේවක සංඛ්‍යාව බඳවා ගැනිම යටතේ ආයතන අංශයට පැවරි ඇති කාර්ය භාරය අනුව 2023 වර්ෂය තුළදි උසස්විම් ලබාදිම්,ස්ථාන මාරුවිම්,විනයානුකුල නියෝග අනුව සේවයෙන් පහකිරිම්, ධූරය අතහැර යැම්, වැටුප් හා වේතනයන්,සේවයෙන් විශ්‍රාම ගැන්විම් හා සේවයෙන් ඉල්ලා අස්විමද පූර්ණ වර්ෂවලදි කටයුතු කර ඇති ආකාරයෙන්ම සිදුවි ඇත.

**සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබැර්තු(*අතිරික්ත) / |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 74 | 56 | 18 //***1 **5 |
| තෘතියික | 130 | 69 | 61**6 / |
| ද්විතියික | 1146 | 878 | 272 / 58***34/ * |
| ප්‍රාථමික | 308 | 249 | 59 / 105*** |
| එකතුව | 1658 | 1252 | 410 |

මූලාශය : ආයතනික දත්ත වාර්තා

** අධිසේවක පදනම මත සිටින සේවකයින්

*** දරන්නාට පෞද්ගලික වන සේ තබා ඇති කාර්ය මණ්ඩලය

- **සේවක හිඟයට හේතු**

ජාතික තරුණ සේවා සභාවට නිළධාරි හිඟයට හේතු ලෙස නිළධාරින් උසස් වීම් ලැබීම, විශ්‍රාම යාම්, ඉල්ලා අස්වීම්, මිය යැම් හා ධූරය හැරයාම් දැක්විය හැකිය.

2021.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ හා ගරු මුදල් අමාත්‍යතුමන්ගේ රාජ්‍ය වියදම් සමාලෝචනය යන මැයින් වූ චක්‍රලේඛ ප්‍රකාරව සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදු කර තිබුන ද මෙතෙක් පත් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම කල් තැබීම අනුව බඳවා ගැනීම් සියල්ල අත්හිටුවන ලෙස දන්වා ඇති බැවින් බඳවා ගැනීම් සිදු කර නොමැත. ඒ අනුව දැනට පුරප්පාඩු 410 පවති.

- **සේවක අතිරික්තයට හේතු**

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/E3/36/4/229/1 හා 2011.01.17 දිනැති ලිපිය මගින් ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලය අනුමත කර ඇති අතර, එහි දී තනතුරු කිහිපයක් දරන්නාට පෞද්ගලික වන සේ තබා ඇත. දැනට එහි සිටින කාර්ය මණ්ඩලය වන අතර, ඔවුන් උසස් වීම්

ලැබීම, විශ්‍රාම යාම්, ඉල්ලා අස්වීම්, මිය යෑම් හා ධූරය හැරයාම් තුළින් එම තනතුරු අහෝසි වනු ඇත. තවද දේශපාලන හේතූන් මත විවිධ ගැටළු වලට මුහුණ දුන් අයට සහන සැලසීම යටතේ දැනට තනතුරු දරණ 11 දෙනෙකු සිටින අතර, එයද අතිරික්ත කාර්ය මණ්ඩලය ලෙස දක්වා ඇත.

- **නව බඳවා ගැනීම් (ස්ථිර)**

2023 වසරේ නව බඳවා ගැනීම් නාම ලේඛනය පහත දැක්වේ.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | බඳවා ගත් දිනය |
|---|---|---|---|---|
| 01 | 4585 | තිසරි පියුමිකා මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 02 | 4582 | ඩබ්.කේ.අනෝජා ලක්මාලි මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 03 | 4581 | එම්.ඒ.කාවින්ද ඩිලාන් වීරසිංහ මයා | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 04 | 4587 | රුවිනි තේනබදු මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 05 | 4586 | ඩී.එම්.අනුෂා ප්‍රියංගනි මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 06 | 4584 | හැඩිගල්ලගේ සජීවනි මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 07 | 4592 | ජේ.එම්.ඒ.මධුමි සුරේඛා ජයසුන්දර මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 08 | 4593 | ජේ.එම්.නයනා කුමාරි මිය | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 09 | 4595 | ඩී.එන්.ප්‍රේමලාල් මයා | කාර්යාල කාර්ය සහායක | 2023.11.10 |
| 10 | 4589 | ඩබ්.එම්.තිලක් කුමාර මයා | රියදුරු 111 | 2023.12.20 |
| 11 | 4591 | බී.ආර්.එස්.සී.සුගතදාස මයා | රියදුරු 111 | 2023.12.20 |
| 12 | 4590 | පී.ඩී.එස්.එස්.ජයවර්ධන මයා | රියදුරු 111 | 2023.12.20 |
| 13 | 4588 | පී.ජී.එස්.එල්. බණ්ඩාර මයා | රියදුරු 111 | 2023.12.20 |

- **නව බඳවා ගැනීම් ( අනියම් )**

2023 වර්ෂයේ නව බඳවා ගැනීම් (අනියම්) නොමැත.

- **නව බඳවා ගැනීම් ( කොන්ත්‍රාත් )**

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | කොන්ත්‍රාත් පත්වීම ලබාදුන් දිනය |
|---|---|---|---|---|
| 01 | 4564 | කේ.ඒ.ඩී. අරවින්ද ලක්ෂිත කුලතුංග මයා | පෞද්ගලික ලේකම් | 2023.03.27 |
| 02 | 4567 | බෝධි මාතුර් මයා | පෞද්ගලික ලේකම් | 2023.09.06 |
| 03 | 4566 | ආර්.එම්.ළහිරු මාධව මයා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 04 | 4567 | කළණ මධුසංක වික්‍රමගේ මයා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 05 | 4568 | ඒ.එම්.ලක්ෂානි උදයංගනී පේමවර්ධන මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 06 | 4569 | කේ.එම්.චමල් සම්පත් මයා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 07 | 4570 | එච්.බී.ලක්ෂ්මිකා සඳුනි ආරියසේන මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 08 | 4573 | එච්.එම්. කැළුම් තුෂාර මහතා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 09 | 4574 | ඩී.එම්.ඉසංකා සඳමාලි මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 10 | 4575 | බී.කේ.පූජනී පියුමි මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 11 | 4579 | එම්.සෞන්දර්යා මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 12 | 4580 | එම්.ප්‍රින්ඩන්යෝඩ් මයා | උපදේශක කෘෂි | 2023.10.03 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | 4572 | ආර්.එම්.මධුෂා සෙව්වන්දි මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 14 | 4571 | එම්.තිනේෂ්කාන්තන් මයා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 15 | 4577 | වී.පුවනචන්ද්‍රන් මයා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 16 | 4576 | කේ.එම්.ඉසුරු තේමිය බණ්ඩාර මහතා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 17 | 4578 | පී.ජී.ඒ.පී.එස්. නදීශානි මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 18 | 4583 | එස්.ඒ.පියුමි නුවන්තිකා මෙය | උපදේශක කෘෂි | 2023.10.03 |
| 19 | 4594 | ආර්.බී.ඩබ්.වී.එම්.බී.රාජකරුණා මයා | උපදේශක කෘෂි | 2023.10.03 |
| 20 | | කේ.ආර්.දොන් අවිෂ්ක ලසිඳු ජයවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ ( නීති සහ සභා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ) කාර්ය සාධන පැවරුම් පදනම | 2023.10.10 |

- **උසස්වීම් ලබාදීම.**

2023 වර්ෂයේ උසස්වීම් ලැබූ නිලධාරින්ගේ විස්තර පහත සඳහන්වේ.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | උසස්වීම් ලබාදුන් දිනය |
|---|---|---|---|---|
| 01 | 1760 | ඩී.එම්.කේ.බී. දිසානායක මයා | නි.අධ්‍යක්ෂ | 2023.08.07 |
| 02 | 2279 | ඩී.මහින්ද සිසිර කුමාර මයා | නි.අධ්‍යක්ෂ | 2023.08.07 |

- **අනියම් සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීම**

2023 වර්ෂයේ අනියම් සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ලබාදී නොමැත.

- **විශ්‍රාම ගැන්වීම**

2023 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරින්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | විශ්‍රාම ගිය දිනය |
|---|---|---|---|---|
| 01 | 3070 | ඩබ්.එම්.පී.ජී. වීරසූරිය මයා | රියදුරු 1 | 2023.01.13 |
| 02 | 1606 | ආර්.පී.වීරසිරි මයා | උපදේශක 1 | 2023.01.14 |
| 03 | 1080 | ටී.එම්. ජයවීර මහතා | ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරී | 2023.01.26 |
| 04 | 1694 | කේ.ඒ.ඩී.ලීලාරත්න මයා | කම්කරු | 2023.02.01 |
| 05 | 2869 | ටී.එම්.සුනිල් තෙන්නකෝන් මයා | ස. තරුණ සේවා නිලධාරී | 2023.02.07 |
| 06 | 4002 | විජේසිරි පෝඩි මයා | කම්කරු | 2023.02.24 |
| 07 | 1365 | ඒ.එම්.ජී.බී.අලහකෝන් මයා | කාර්මික 1 | 2023.03.02 |
| 08 | 1846 | එස්.රවිකුමාර් මයා | ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරී | 2023.03.17 |
| 09 | 3051 | වයි.ජී.සරත් ගාමිණී මයා | මුරකරු 1 | 2023.06.28 |
| 10 | 1156 | ජී.ලක්ෂ්මන් පෙරේරා මයා | කළ.සහකාර 1 | 2023.07.25 |

| | | | | |
|---|---|---|---|---|
| 11 | 3519 | ඒ.ජී.නන්දා මාලනි මිය | කළමනාකරණ සහකාර 11 | 2023.07.31 |
| 12 | 1605 | ඩී.කේ.එදිරිසිංහ මිය | උපදේශක 1 | 2023.08.01 |
| 13 | 1941 | සුමිත් ප්‍රියන්ත රාජපක්ෂ මයා | උපදේශක 1 | 2023.08.16 |
| 14 | 1306 | ඒ.ඒ.නීල්නන්ද මහතා | ජෝ‍යා. තරුණ සේවා නිලධාරී | 2023.08.28 |
| 15 | 2736 | ඩබ්.එම්.මංගලිකා පුෂ්පකාන්ති මිය | කළ.සහකාර 1 | 2023.08.29 |
| 16 | 1357 | බී.ඩී.ඩබ්.ඩී.කේ. කරුණාරත්න මයා | දි.ත.සේ.නි ස.අ (රාජකාරි ඉටුකරන ) | 2023.09.09 |
| 17 | 1645 | එස්.ජේ.එම්.සෙනෙවිරත්න මයා | මුරකරු 1 | 2023.09.14 |
| 10 | 1688 | ඩබ්.ජී.සසංක වැකඩපොල මයා | මුරකරු 1 | 2023.09.26 |
| 11 | 3511 | ඩී.අයි.රෝහිණී මිය | කළ. සහකාර 11 | 2023.10.03 |
| 12 | 1590 | එච්.බී.සරත් චන්ද්‍රපාල මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2023.10.14 |
| 13 | 1650 | එස්.එම්.විජේරත්න මයා | මුරකරු 1 | 2023.10.31 |
| 14 | 3999 | චාන්දනී රණහේවා මිය | කම්කරු | 2023.11.09 |
| 15 | 1468 | බී.එම්.පොඩිමහත්තයා මයා | කම්කරු | 2023.12.02 |
| 16 | 2881 | ගංගා දේවි පුවනරාජ් මිය | කළ.සහකාර 11 | 2023.12.03 |
| 17 | 1872 | එල්.බී.යමුනා හේමමාලා මිය | උපදේශක 1 | 2023.12.05 |
| 18 | 1476 | කුමුදුණී කරුණාරත්න මිය | කළ.සහකාර 1 | 2023.12.12 |
| 19 | | එම්.ජී.එස්.කාන්ති තිලකලතා මිය | කම්කරු | 2023.12.15 |
| 20 | 2119 | එම්.එස්.ජේ.පී.රත්නායක මයා | මුරකරු 1 | 2023.12.23 |
| 21 | 3474 | ඩබ්.සරත් වසන්ත ප්‍රනාන්දු මයා | රියදුරු 1 | 2023.12.31 |

- **සේවයෙන් ඉල්ලා අස්වීම**

විවිධ හේතුන් මත 2023 වර්ෂයේ පහත නම් සඳහන් නිලධාරින් සභාවේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | සේවයෙන් ඉල්ලා අස්වු දිනය |
|---|---|---|---|---|
| 01 | 2185 | එල්. වි. අරුණ ශාන්ත පෙරේරා මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.01.01 |
| 02 | 2353 | එන්.පී.ජී.චන්ද්‍රලතා මිය | මූල්‍ය නිලධාරි | 2023.01.20 |
| 03 | 4138 | ජයරාජන් රජීව් මයා | ස.ත.සේ.නි | 2023.01.27 |
| 04 | 4268 | පි.එම්.එම්.ප්‍රමෝදි මිය | ස.ත.සේ.නි 111 | 2023.01.30 |
| 05 | 3138 | එච්.ඩී.නිහාල් සේනානායක මයා | කම්කරු | 2023.01.31 |
| 06 | 2392 | ආර්.ඩී.නිහාල් රාජපක්ෂ මයා | කළමනාකරණ සහකාර 11 | 2023.02.01 |
| 07 | 4092 | ඩි.එස්.ජී.ඒ.ජයවර්ධන යාපා මයා | ස.ත.සේ.නි | 2023.02.01 |
| 08 | 2251 | ඩබ්.ඒ.ආර්.වල්පොල මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.02.01 |
| 09 | 1314 | හොඳමුණි කමලසිරි මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.02.13 |
| 10 | 3318 | සීතා නැන්සිලතා මිය | කම්කරු | 2023.02.22 |
| 11 | 1660 | ධර්මසේන වන්නිආරච්චි මයා | අරක්කැමි | 2023.03.01 |
| 12 | 3131 | එච්.ජී.කීර්ති වි. තිලකරත්න මයා | අරක්කැමි | 2023.03.05 |
| 13 | 3041 | ඒ.එම්.එස්.එම්.මහින්ද කුමාර මයා | කළමනාකරණ සහකාර 11 | 2023.03.07 |
| 14 | 1838 | පී.ඒ.දයා කුමාරි මිය | තරුණ සේවා නිලධාරි 1 | 2023.03.15 |
| 15 | 2205 | ආර්.එම්.එස්. පියසිලි රත්නායක මිය | තරුණ සේවා නිලධාරි 1 | 2023.03.27 |
| 16 | 1596 | එම්. හේමන්ත ද සිල්වා මයා (60 සම්පූර්ණවීම නිසා විශ්‍රාම ) | තරුණ සේවා නිලධාරි 1 | 2023.04.03 |
| 17 | 2179 | සුනිල් ශාන්ත මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.04.30 |
| 18 | 1793 | කේ.එල්.පුෂ්ප කුමාර මයා | කළමනාකරණ සහකාර 1 | 2023.05.02 |
| 19 | 2844 | කේ.එම්.අසෝක කුමාර මයා | මුරකරු 1 | 2023.05.02 |
| 20 | 2593 | ඩි.පි.ජී.දයාරත්න මයා | කම්කරු | 2023.05.02 |
| 21 | 1944 | එම්.එම්.වසන්ත අබේරත්න මයා | උපදේශක 1 | 2023.05.10 |

| | | | | |
|---|---|---|---|---|
| 22 | 2825 | එම්.ඩී.ඥාණපාල මයා | අරක්කැමි | 2023.05.18 |
| 23 | 2556 | අයි.එම්.ඒ.අජිත් ප්‍රසන්න කුමාර මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.05.30 |
| 24 | 3855 | ඉෂානි කෞෂල්‍යා ගල්හේනගේ මිය | කළමනාකරණ සහකාර 111 | 2023.06.01 |
| 25 | 1774 | එස්.ටී.බී.කිර්තිසේන මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.06.01 |
| 26 | 4547 | අෂාන් සමරවීර මයා | ගොවිපල සහකාර | 2023.06.05 |
| 27 | 1961 | ඩබ්.ඒ.එම්.වී.වික්‍රමසිංහ මයා | උපදේශක 1 | 2023.06.30 |
| 28 | 2559 | ඩී.ගුණසිරි මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.07.01 |
| 29 | 3819 | තාරක මධුශංක රදම්පොළ මයා | කළමනාකරණ සහකාර 111 | 2023.07.12 |
| 30 | 1919 | පාලිත වික්‍රමසිංහ මදනායක මයා | කම්කරු | 2023.07.18 |
| 31 | 3445 | එම්.ඩබ්.අජිත් කරුණාසිරි මයා | කම්කරු | 2023.08.01 |
| 32 | 2094 | ආර්.ඒ.ඉන්දික පෙරේරා මයා | කම්කරු | 2023.08.14 |
| 33 | 2961 | එච්.කේ.ස්වර්ණලතා මිය | කම්කරු | 2023.08.15 |
| 34 | 4564 | කේ.ඒ.ඩී.ඒ.ලක්ෂිත කුලතුංග මයා | පෞද්ගලික ලේකම් | 2023.08.27 |
| 35 | 3303 | කේ.ඥානේශ්වරි මිය | උපදේශක 1 | 2023.08.30 |
| 36 | 2302 | සිරියා නන්දනී මිය | කම්කරු | 2023.09.01 |
| 37 | 4344 | එච්.යූ.එම්.චන්දිමා ලක්මාලි මිය | රූපලාවන්‍ය | 2023.09.01 |
| 38 | 1836 | එස්.එම්.කීර්තිසිංහ මයා (60 සම්පූර්ණවීම නිසා විශ්‍රාම ) | තරුණ සේවා නිලධාරි 1 | 2023.09.21 |
| 39 | 4315 | ඩී.වී.යූ.තිවංක දික්වැල්ල මයා | කළමනාකරණ සහකාර 111 | 2023.09.23 |
| 40 | 2630 | එස්.එස්.කේ අමරසූරිය මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.09.23 |
| 41 | 1823 | ප්‍රසාද් අනුරාධ මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.09.30 |
| 42 | | කේ.ආර්.දොන් අවිෂ්ක ලසිදු ජයවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ ( නීති සහ සභා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ) කාර්ය සාධන පැවරුම් පදනම | 2023.10.10 |
| 43 | 4541 | නවෝද් චතුරංග ගුණසේකර මයා | ඉංජිනේරු ( සිවිල් ) | 2023.10.25 |
| 44 | 4506 | එම්.ටී.ඒ.නදිශානි සිල්වා මිය | විගණන නිලධාරි | 2023.10.28 |
| 45 | 1756 | කේ.සිරිමල් මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.10.31 |
| 46 | 1786 | කේ.ඒ.එන්.පී . ජයවික්‍රම මයා | ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි | 2023.11.01 |
| 47 | 3409 | එල්.රොබින්සන් ක්ලෙමන් මයා | සංචාරක බංගලා භාරකරු | 2023.11.21 |
| 48 | 2195 | කේ.ජී.ඉන්ද්‍රානි මිය | තරුණ සේවා නිලධාරි 1 | 2023.11.23 |
| 49 | 4319 | අයි.ඩබ්.එම්.අයි.ඩබ්.සී.දිනේල්කා ඉලංගකෝන් මිය | ස.ත.සේ.නි 111 | 2023.11.26 |
| 50 | 3754 | එම්.දිනේෂ් කරුණාරත්න මයා | ස.ත.සේ.නි | 2023.11.27 |
| 51 | 3630 | එල්.ආර්.පී එම්. ලංකාතිලක මයා | ස.ත.සේ.නි | 2023.11.27 |
| 52 | 3475 | හේවගේ නිශාන්ත මයා | රියදුරු 1 | 2023.11.30 |
| 53 | 2016 | එම්.එම්.එස්.එම්.හේරත් මයා | උපදේශක 1 | 2023.11.30 |
| 54 | 1768 | ඩී.එම්. ක්‍රිෂාන්ත කුමාර මයා | ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි | 2023.11.30 |
| 55 | 2566 | විජේරත්න මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.12.31 |
| 56 | 1625 | ඒ.ජී.කාරියවසම් මයා | උපදේශක 1 | 2023.12.31 |

- **ධුරය අතහැර යාම**

විවිධ හේතූන් මත පහත නම් සඳහන් නිලධාරීන් 2023 වර්ෂයේ ධුරය අතහැර ගියා සේ සලකා කටයුතු කර ඇත.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | ධුරය අතහැර ගිය දිනය |
|---|---|---|---|---|
| 01 | 3225 | ඩී.එම්.ඩී.නුවන් අනුරාධ රූපසිංහ මයා | රියදුරු 11 | 2023.01.31 |
| 02 | 4555 | වී ත්‍යාගරාජා මහතා | කෘෂි ක්ෂේත්‍ර සහායක | 2023.03.09 |
| 03 | 4551 | රුමේෂ් ගිහාන් සෙනෙවිරත්න මයා | කෘෂි ක්ෂේත්‍ර සහයක | 2023.03.20 |
| 04 | 4556 | ජී.ජී.තුෂාංග මධුෂාන් මහතා | තොරතුරු තාක්ෂණ | 2023.03.20 |
| 05 | 4557 | යසිරු නිර්මල හේරත් මහතා | තොරතුරු තාක්ෂණ | 2023.03.20 |
| 06 | 3791 | තිළිණ ලක්මාල් මුදුන්කොත්ගේ මයා | ස.ත.සේ.නි | 2023.04.21 |
| 07 | 3573 | එස්.එම්.ආර්.පෙරේරා මයා | කළමනාකරණ සහකාර 111 | 2023.04.26 |
| 08 | 3994 | එස්.දර්ශන් මයා | රියදුරු 111 | 2023.05.04 |
| 09 | 3815 | කසුන් ධනංජය ද සිල්වා මයා | ස.ත.සේ.නි | 2023.05.16 |
| 10 | 4426 | ආර්.එම්.සී.හර්ෂ රත්නායක මහතා | තොරතුරු තාක්ෂණ | 2023.06.02 |
| 11 | 4261 | එම්.කේ.ටී.සඳරුවන් මයා | කළමනාකරණ සහකාර 111 | 2023.07.28 |
| 12 | 4560 | එන්.කේ.රබිත සම්පත් මයා | සහය නිෂ්පාදක | 2023.08.23 |
| 13 | 1733 | ජී.ආර්.එන්.තිලක් කරුණාරත්න මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.10.28 |

- **නැවත සේවයේ පිහිටුවීම**

2023 වර්ෂයේ නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ නිලධාරීන්ගේ විස්තර පහත දැක්වේ.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | නැවත සේවයේ පිහිටවූ දිනය |
|---|---|---|---|---|
| 01 | 2797 | වී.සතොසඩෝසන් මයා | මුරකරු | 2023.01.31 |

- **සේවය අවසන් කිරීම**

විවධ හේතූන් මත 2023 වර්ෂයේ සේවය අවසන් කර ඇති නිලධාරීන්ගේ විස්තර පහත දැක්වේ.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | සේවය අවසන් කල දිනය |
|---|---|---|---|---|
| 01 | 4548 | ඩී.එල්.සී.එන්. මධුෂංක මයා | කෘෂි ක්ෂේත්‍ර සහයක | 2023.03.09 |
| 02 | | එම්.පී.කේ. විදානආරච්චි මයා | නි.අ(සංවර්ධන) දිවිතියන පදනම | 2023.10.31 |
| 03 | | එච්.එම්.සී.ජී.දයාරත්න මයා | නි.අ(මුදල්) වැඩබලන පදනම | 2023.11.08 |

- **වැඩ තහනම් කිරීම**

2023 වර්ෂයේ නිලධාරීන්ගේ වැඩ තහනම්කර නොමැත.

- **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**

2018,2019,2020,2021,2022 වර්ෂවලට අදාලව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වා නොමැති බැවින් 2023 අගෝස්තු මස 05,06 බුවනකබා විද්‍යාලය - මහරගමදී පවත්වන ලදි.2023.12.28 දින ප්‍රතිඵල නිකුත් කරන ලදි.

- **දුරකථන පහසුකම්.**

2023 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ අංශ සඳහා දුකරථන පහසුකම් ලබා දී නැත.

- **ණය අත්තිකාරම්**

ජාතික තරුණ සේවා සභාවේ සියළුම සේවකයින්ට ආපදාණය ලබා ගැනීම සඳහා පහසුකම් සලස්වා ඇත. ඒ අනුව 2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා ආපදා ණය වශයෙන් රු 40,879,425.85 මුදලක් සේවකයින් හා නිලධාරින්ට ලබා දී ඇත.

- **කම්කරු විනිශ්චය සභාවෙන් අධිකරණමය නඩු විභාග**

ජාතික තරුණ සේවා සභාව විසින් ගන්නා ලද විනය නියෝගයන්ට විරුද්ධව සේවකයන් විසින් අධිකරණ කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති නඩු 2023 වර්ෂයේදී විභාගයට ගෙන ඇත.

| අනු අංක | සේ.අ. අංකය | නම | තනතුර | මිය ගිය දිනය |
|---|---|---|---|---|
| 01 | 3440 | ආර්.ඒ.සුදත් රූපසිංහ මයා | කම්කරු | 2023.01.29 |
| 02 | 3538 | පී.ඩී.ඒ.ජේ. ගුණතිලක මයා | විගණන නිලධාරි | 2023.03.01 |
| 03 | 4232 | කේ.ඒ.ඩබ්.අරුණ ශාන්ත මයා | පරිගණක | 2023.04.02 |
| 04 | 2075 | යූ.ජී.සන්ධ්‍යා උපමල්ලිකා මිය | අරක්කැමි | 2023.06.03 |
| 05 | 2468 | කේ අලගුරාසා මයා | තරුණ සේවා නිලධාරි 1 | 2023.06.03 |
| 06 | 4429 | කේ.ජගත් සුසිර වරුණතිලක මයා | පරිගණක චිත්‍රක | 2023.06.16 |
| 07 | 2281 | කේ.එස්.පී. කවිතිලක මයා | කළමනාකරණ සහකාර 1 | 2023.07.06 |

- **අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිභාර අරමුදල**

2023 වර්ෂය තුළදි විශ්‍රාම ගන්වන ලද සහ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර රැකියා සඳහා යැමට ජාතික තරුණ සේවා සභාවෙන් ඉල්ලා අස්වි ඇති කාර්ය මණ්ඩලය සඳහා සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්ත භාර අරමුදල් ලබා දීමට කටයුතු කර ඇත.

2023 වර්ෂය තුළදි විශ්‍රාම ගන්වන ලද සහ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර රැකියා සඳහා යැමට ජාතික තරුණ සේවා සභාවෙන් ඉල්ලා අස්වි ඇති කාර්ය මණ්ඩලය සඳහා සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්ත භාර අරමුදල් ලබා දීමට කටයුතු කර ඇත.

- **ඉඩම් පවරා දීම.**

2023 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාව වෙත ඉඩම් පැවරීමක් සිදුකර නොමැත.

- **පුහුණුව ලබාදුන් අභ්‍යාසලාභීන්ගේ තොරතුරු**

2023 වර්ෂයේ පුහුණුව ලබාදුන් අභ්‍යාසලාභීන් සංඛ්‍යාව - 128

**වෙනත් ආයතනවලට අනුයුක්ත කර නැවත ජාතික තරුණ සේවා සභාවට පැමිණි නිලධාරින්**

2023 වර්ෂයේ වෙනත් ආයතනවලට නිළධාරින් යොමු කර නැත.

## 5.2 ප්‍රසම්පාදන කටයුතු

**2022-04 චක්‍රලේඛය අනුව සියළු කාර්යාලයීය මිළදී ගැනීම් සීමා කර ඇතිබැවින් කිසිදුමිළ දී ගැනීමක් සිදු කර නොමැත.**

## 5.3 ප්‍රවාහන කටයුතු

ජාතික තරුණ සේවා සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා විවිධ අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබනු වැඩසහන් වලදී ප්‍රධානතමසහය සේවාවක් වශයෙන් ප්‍රවාහන සේවා සැපයීම සිදු කෙරේ.

## 5.4 අභ්‍යන්තර විගණක කටයුතු

ජාතික තරුණ සේවා සභාවේ විමධ්‍යගතව පවතින මූල්‍ය, පරිපාලන හා සංවර්ධන කටයුතු ප්‍රධාන කාර්යාලයේ අංශ 23,පළාත් කාර්යාල 10, දිස්ත්‍රික්කාර්යාල 26, පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපල 61 ක් ආවරණය වන පරිදි සකස්කරන ලද වාර්ෂික විගණන සැලැස්මක් අනුව විගණන කටයුතු සිදුකරනු ලබන අතර, මීට අමතරව ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිතව සීමාසහිත තරුණ සේවා සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය, හා ඊට ඒකාබද්ධව දිවයින පුරා විහිදී ඇති සමුපකාර සමිති ජාලා 26 හා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය යන ආයතන ද විගණනයට ලක්කෙරේ. ඒ අනුව මෙම වර්ෂයේ විගණන හා විමර්ශන වාර්තා 67 ක් ඉදිරිපත් කර ඇත.

**මීට අමතරව පහත සඳහන් කාර්යභාරයන් ද මෙම අංශය මගින් ඉටුකෙරේ.**

- ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් අරමුදල් සම්පාදිතව ක්‍රියාත්මක කරණු ලබන ව්‍යාපෘති හා විවිධ වැඩසටහන්හි මූල්‍ය හා භෞතික කටයුතු පරීක්ෂාව**(Skill Sector Development Project/Child Fund/UNFPA/World Bank/ADB Etc.)**
- 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන විගණකාධිපති වාර්තාව (කෙටුම්පත) සඳහා පිළිතුරු සකස් කිරීම හා යොමු කිරීම හා 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත් 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක විගණකාධිපති වාර්තාව

  ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාව හා පොදු ව්‍යාපාර අනුකමිටු වලදී පැන නගින කරුණු වලට අදාලව නිකුත් කරනු ලබන නිර්දේශ හා නිරීක්ෂණ සම්බන්ධව පිළිතුරු හා ප්‍රගති සකස් කිරීම.
- විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීම හා වාර්තාකරණය.

- අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් ලබාදෙන නියෝග මත සිදුකරන විශේෂ විමර්ශන කටයුතු.
- අදාල රේඛීය අමාත්‍යංශය විගණන හා කළමණාකරන කමිටුරැස්වීම් සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම.
- රේඛීය අමාත්‍යංශය හා විගණකාධිපති වෙත අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධ කාර්තුමය ප්‍රගතිය ඉදිරිපත් කිරීම.

<u>විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීම හා වාර්තාකරණය.</u>

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 4 ක් ලෙස නිර්ණය කර ඇති අතර, 2023 වර්ෂයේ කමිටු රැස්වීම් වාර 03 ක් පවත්වන ලදි. 2023 වර්ෂයේ 04 වන කාර්තුවට අදාල රැස්වීම 2023.12.12 දින පැවැත්වීමට සියලු කටයුතු සැලසුම් කර තිබුණද ගරු විෂය භාර අමාත්‍යවරයා වෙනස්වීම හේතුවෙන් පාලක මණ්ඩලය විසිරුවා හැරීම හේතුවෙන් පැවැත්වීමට නොහැකිවිය.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුලත් වාර්තාවන් සහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පින්ඩනයක් පහත දක්වා ඇත.

- රජයේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණන හා විමර්ශන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ ලබාදීම
- සමස්ථ ඉඩම් හා දේපල පවරා ගැනීමේ පටිපාටිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය
- ආයතනික සේවක මණ්ඩල කටයුතු සම්බන්ධ සමාලෝචනය
- ආයතනික සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචනය
- වාර්ෂික ගිණුම් කටයුතු සම්බන්ධව
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිළිබඳ විමර්ශනයට ලක්කිරීම.

## 5.5 ලේකම් කාර්යාලය හා සම්බන්ධ කටයුතු

ලේකම් අංශය මගින් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එහිදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශ සහ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත බෙදා දීම සිදු කරනු ලබයි. ඊට අමතරව ජාතික තරුණ සේවා සභාවේ වෙනත් වැඩසටහන් වලට අදාලව අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරී කටයුතු ද ඉටු කරනු ලැබේ.

## 5.6 නීති විමර්ශන හා සම්බන්ධ කටයුතු

ජාතික තරුණ සේවා සභාව විසින් පවරා ඇති නඩු සම්බන්ධව හා මෙම සභාවට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳව මෙම සභාව වෙනුවෙන් හා/හෝ සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට පෙනී සිටීම හා කරුණු

ඉදිරිපත් කිරීම ද , අවශ්‍යතාවය අනුව නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම ආදි කටයුතු නීති විමර්ශන අංශය මගින් සිදුකෙරේ.

## 5.7 ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

ඉදිකිරීම් / නඩත්තු අංශය මඟින්, දිවයින පුරා පවතින සියළුම පළාත් කාර්යාල , දිස්ත්‍රික්කාර්යාල හා තරුණ මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුවට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණ කටයුතු ඉටු කරනු ලබයි. ඊට අමතරව මහරගම ප්‍රධාන කාර්යාලයේ පල්දොරු පද්ධතියේ නඩත්තු කටයුතු කිරීම, ප්‍රධාන රංග ශාලාවේ දෛනික නඩත්තු කටයුතු කිරීම, උද්‍යාන අලංකරණ කටයුතු ඉටුකිරීම හා තරුණ මධ්‍යස්ථාන දෛනික නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු ඉටු කරනු ලබයි.

2023 වසර සඳහා රුපියල් මිලියන 95 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් වූ අතර, පසුගිය වසර වල ක්‍රියාත්මක වෙමින් පැවති පහත ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති සාර්ථකව අවසන් කර භාවිතයට ගනිමින් **පවතී.**

- නුවරඑළිය සංචාරක බංගලාවේ වැඩ අවසන් කර ඇත.
- අර්ධව නිමකළ මොනරාගල පුහුණු මධ්‍යස්ථානයේ පන්ති කාමර 04 වැඩ අවසන් කර ඇත.
- අර්ධව නිමකර ඇති දඹුල්ල පුහුණු මධ්‍යස්ථානයේ පන්ති කාමර 04 වැඩ අවසන් කිරීම.
- අර්ධව නිමකර ඇති ත්‍රිකුණාමල ලව් ලේන් පුහුණු මධ්‍යස්ථානයේ පන්ති කාමර හතරක වැඩ අවසන් කිරීම.
- මහරගම තරුණ මධ්‍යස්ථානයෙහි පල්දෝරු පද්ධතියේ නවීකරණ කටයුතු ඉටුකිරීම නැවත ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සහ තරුණ මධ්‍යස්ථානයේ දෛනික නඩත්තු කටයුතු ඉටුකිරීම.
- රුපියල් මිලියන153 වැය කරමින් පුහුණු මධ්‍යස්ථාන දිස්ත්‍රික්කාර්යාල හා ගොවිපළ මධ්‍යස්ථාන අලුත් වැඩියා සහ නවීකරන කටයුතු 2023 වසරේ ඉටුකර ඇත.

## 5.8 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කණ්ඩායමක් සඳහාම, ශරීර සුවතාව වර්ධනය කිරීම | 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වලක්වා ගැනිමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | ක්‍රීඩා වැඩසටහන් සඳහා සහභාගි වූ සහභාගිකයින් | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම | 2030 වන සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් ඇතුලුවල අදාල කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහල නැංවීම | 2023 වසරේ වෘත්තිය, ව්‍යවසායකත්ව පුහුණු ලබා ගත් තරුණ තරුණියන් සංඛ්‍යාව | | √ | |

## 5.9 ජයග්‍රහණ හා අභියෝග - 2023

**ජයග්‍රහණ**

- බාහිර ආයතන සමග සම්බන්ධිකරණය වෙමින් තරුණයන්ට නායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර තරුණ දිනය මුල්කර ගනිමින් වැඩසටහන් රැසක් තරුණ තරුණියන්ගේ ස්වේච්ඡා මැදිහත් විමෙන් ක්‍රියාත්මක කිරීම.
- තරුණ තරුණියන් ස්වේච්ඡාවෙන් දිවයිනපුරා සෑම දිස්ත්‍රික්කයකම ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**අභියෝග**

- යෞවන සමාජ වලින් බැහැරව සිටින තරුණයන් නැවත යෞවන සමාජ වෙත නැඹුරු කරවීම.
- දිවයින පුරා අවශ්‍යය සේවා සැපයීමට අවශ්‍යය සේවකයන් ප්‍රමාණවත් නොවීම.

## 06. කාර්ය සාධන වාර්තාව - 2023

### 6.1 ආයතනයේ කාර්ය සාධනය

**i. ප්‍රතිපාදන සැලසීම**

2023 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ සමස්ත ලැබීම් වලින් රජයේ දායකය (පුනරාවර්ථන) රු. 1325,050,000 ක් හා රජයේ දායකය (සංවර්ධන) ක් ද රු. 411,788,000 ක් ද, ජාතික තරුණ මධ්‍යස්ථාන ආදායම් රු. 78,155,494.72 ක් ද පුහුණු මධ්‍යස්ථාන ආදායම රු.229,930,344.07 ක් ද, විවිධ ආදායම් ලෙස 12,320,346.48 ක් ද , සංදර්ශන ආදායම් 2,273,740.00 ක්ද අභ්‍යන්තර ඉපයීම් ලෙස ලැබී ඇත.

**ii. සංවර්ධන වැඩසටහන්**

ජාතික තරුණ සේවා සභාව 2023 වර්ෂය තුළ පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ තරුණ සංවර්ධන කාර්යය දියත් කෙරිණි. ඒ අනුව,

- තරුණ තරුණියන් ජාලගත කිරීම හා අනාගතයට ගැලපෙන තරුණ පරපුරක් නිර්මාණය කිරීම වෙනුවෙන් වැඩසටහන් 14,907 ක් පවත්වා ඇතිඅතර මේ සඳහා තරුණ තරුණියන් 616,872 ක් සහභාගි විය. ඒ වෙනුවෙන් රු.මි.245.53 ක මුදලක් වැය දරා ඇත.
- තරුණයන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය වෙනුවෙන් වැඩසටහන් 2035 ක් පවත්වා ඇති අතර මේ සඳහා තරුණ තරුණියන් 115,251 ක් සහභාගි විය. ඒ වෙනුවෙන් රු.මි.139.14 ක මුදලක් වැය දරා ඇත.
- තරුණ ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් වැඩසටහන් 35 ක් පවත්වා ඇති අතර මේ සඳහා තරුණ තරුණියන් 1,774 ක් සහභාගි විය. ඒ වෙනුවෙන් රු.මි.92.75 ක මුදලක් වැය දරා ඇත.
- අභ්‍යන්තර ධාරිතා සංවර්ධනය වෙනුවෙන් කාර්ය මණ්ඩලයට වැඩසටහන් 48 ක් පවත්වා ඇති අතර මේ සඳහා ඒ ඒ වැඩසටහන් සඳහා නිලධාරීන් 1569 ක් සහභාගි විය. ඒ වෙනුවෙන් රු.මි.21.66 ක මුදලක් වැය දරා ඇත.
- ගෝලීය සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ වේ තරුණයන් සවිබලගැන්වීම වෙනුවෙන් වැඩසටහන් 53 ක් පවත්වා ඇති අතර මේ සඳහා තරුණ තරුණියන් 3126 ක් සහභාගි විය. ඒ වෙනුවෙන් රු.මි.11.62 ක මුදලක් වැය දරා ඇත.

### 6.2 කෙටිකාලීන ක්‍රියාමාර්ග හා මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

**කෙටිකාලීන ක්‍රියාමාර්ග**

- කාලීන තරුණ අවශ්‍යතා හඳුනා ගැනීම.
- තරුණ තරුණියන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ගොඩ නැංවීම සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශීය හා විදේශීය වෙළෙඳ පොළ ඉලක්ක කරගත් පාඨමාලා හඳුන්වාදීම.

- පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- විදේශ රැකියා අවස්ථා මත ජාත්‍යන්තර භාෂා පාඨමාලා වැඩි කිරීම
- දැනුම සහ පහසුකම් ලබාදෙමින් තරුණ ව්‍යවසායකයින් බිහිකිරීම.
- දේශීය හා විදේශීය තරුණ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියට තරුණ තරුණියන්ට පහසුකම් හා අවස්ථා ලබා දීම.

**මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග**

- ආයතනික දැක්ම, අරමුණු හා පරමාර්ථ අනුව උපාය මාර්ගික ක්‍රම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ආයතනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ තරුණ සංවර්ධන කටයුතු සඳහා සමාජ ආකර්ෂණය වැඩි කිරීම.
- කෘෂිකාර්මික ආර්ථිකයකට සහ කෘෂි ව්‍යවසායකත්වයකට තරුණයන් යොමු කිරීම.
- විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සහයෝගීතාවයෙන් තරුණයින් සඳහා ඇති විදේශීය වෙළඳපල අවස්ථා ලබා ගැනීම.
- කාර්යමණ්ඩල කාර්යක්ෂමතාවය උදෙසා ඇගයීම්, පුහුණු ලබා දීම තුළින් මානසික අසමතුලිතතාවය හා අවිනිශ්චිතභාවයන් අවම කිරීම හා නිලධාරින් අභිප්‍රේරණය කිරීම.
- කාලීන අවශ්‍යතා අනුව, තාක්ෂණික ක්‍රමවේද ආයතනය තුළ නිර්මාණය කිරීම.

## 07. 2023 වර්ෂයට අදාළ විගණන විමසුම් මගින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

| අඅ. | විගණන විමසුම් අංකය | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති තොරතුරු | ගනු ලැබූ ක්‍රියාමාර්ග හා අපේක්ෂිත ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| 01 | SYA/B/NYSC/2022/AQ/19 | නිස්කෝ වීඩියෝ අංශයේ කාර්යයන් පරීක්ෂාව. | 2023.02.17 පිළිතුරු යවා ඇත. |
| 02 | SYA/B/NYSC/2022/AQ/20 | Global Leaders වැඩසටහන 2022 - පිළිබඳ පරීක්ෂාව. | 2023.02.01 පිළිතුරු යවා ඇත. |
| 03 | SYA/B/NYSC/2022/AQ/18 | ජාතික තරුණ සේවා සභාව යටතේ ක්‍රියාත්මක ස්වේච්ඡා සේවක වැඩසටහන -(SL Volunteer) වැඩසටහන. | 2023.01.31 පිළිතුරු යවා ඇත. |
| 04 | SYA/B/NYSC/2022/AQ/21 | ප්‍රජා හා ධාරිතා සංවර්ධන වැඩසටහන පිළිබඳ පරීක්ෂාව. | 2023.03.27 පිළිතුරු යවා ඇත. |
| 05 | SYA/D/NYSC//2022AQ/22 | පුහුණු මධ්‍යස්ථානවල අවශ්‍යතා සඳහා පරිගණක .200ක් මිලදී ගැනිම | 2023.02.27 පිළිතුරු යවා ඇත. |

| | | | |
|---|---|---|---|
| 06 | SYA/D/NYSC//2022AQ/23 | බිත්තර දමන කිකිලියන් සඳහා කුකුල් කෑම මිලදී ගැනීම පිළිබඳ පරීක්ෂාව. | 2023.0පිළිතුරු 5.09 .යවා ඇත |
| 07 | SYA/D/NYSC//2022AQ/24 | ජාතික තරුණ සේවා සභාවේ ඌව පලාත් කාර්යාලයදිස්ත්‍රික් කාර්යාලය , ඔරුබැදිවැව පුහුණු ,හා ලෙව්වේගොඩ .මධ්‍යස්ථානවල විගණන පරීක්ෂාව | 2023.0පිළිතුරු 5.15 2024.10.25 .යවා ඇත අමාත්‍යාංශයට ලිපියක් යොමු කර මෙම ඉඩම් කොටස නිරවුල් කර ගැනීමට බදුල්ල දිස්ත්‍රික් ලේකම් තුමා ලිපියක් මගින් දැනුවත් කරන ලෙසට කර ඇති ඉල්ලීමට තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් දින 2024.11.25 .ඉල්ලීම් කර ඇත |
| 08 | SYA/D/NYSC//2022AQ/25 | ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශයේ විගණන පරීක්ෂාව. | 2023.05.04 පිළිතුරු යවා ඇත.<br>ඒඩින්බරෝ ආදිපාද ජාත්‍යාන්තර තිළිණ පදනම මගින් ලබා දෙන උපදෙස් මත වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. |
| 09 | SYA/D/NYSC//2022AQ/27 | සේවක මණ්ඩල කළමනාකරණය | 2023.05.15 පිළිතුරු යවා ඇත.<br>හෙළිදරව් වී ඇති කරුණු සම්බන්ධව විෂය ලිපිකරුවන් දැනුවත් කර පුද්ගලික ලිපිගොණු භාර විෂය ලිපිකරුවන්ට පුහුණු සැසිවාර තුනක් 28 හා 2023.02.16,23 දින පවත්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| 10 | SYA/D/NYSC//2022AQ/28 | ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වා ගෙන යනු ලබන මෝටර් කාර්මික ශිල්පී පාඨමාලාව පිළිබඳ පරීක්ෂාව. | 2023.0පිළිතුරු යවා 7.05 මෝටර් රථ කාර්මික .ඇත පාඨමාලාවේ මොඩියුලවල ප්‍රායෝගික කටයුතු සිදු කිරිමේදි පුහුණු මධ්‍යස්ථාන තුල අදාල පහසුකම් නොමැති අවස්ථාවලදි. ඒම පහසුකම් සහිත රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන සමඟ ඒකගතා ඇති කර ගෙන අදාල ප්‍රායෝගික කටයුතු ඒම ආයතන වලදි සිදු කිරීමට කටයුතු යොදා ඇතපුහුණු . පාඨමාලා කාලය තුලදීම මෙම ප්‍රායෝගික අභ්‍යාස සඳහා .අභ්‍යාසලාභීන් යොමු කරයි |
| 11 | SYA/D/NYSC//2022AQ/29 | ජිනරථන පුහුණු මධ්‍යස්ථානයේ කාර්යසාධනය පිළිබඳ පරික්ෂාව. | .පිළිතුරු යවා ඇත 2023.07.14 |
| 12 | SYA/D/NYSC//2022AQ/30 | කළුගල්ඔය ගොවිපල පිළිබඳ පරීක්ෂාව . | .පිළිතුරු යවා ඇත 2023.09.27 |
| 13 | SYA/D/NYSC//2023AQ/01 | බටංගල පුහුණු මධ්‍යස්ථානයේ හා ගොවිපලේ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාව. | .පිළිතුරු යවා ඇත 2023.11.01දැනට රාජකාරිය කටයුතු වෙනත් කළමනාකරණ සහකාරවරියකට පවරා ඇති අතරඅඩුපාඩු නිවැරදි කර , .ගැනීමට උපදෙස් ලබා දී ඇත |
| 14 | SYA/D/NYSC//2023AQ/02 | විභාග අංශයේ විභාග පැවැත්විම සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාව. | .පිළිතුරු යවා ඇත 2023.09.20 ගෙවීමට තිබූ සියළුම වවුචර්පත් ගෙවීම් කර ඇත. |
| 15 | SYA/D/NYSC//2023AQ/03//1 | දෙහිවල පුහුණු මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ජාතික තරුණ සේවා සභාව හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව එළඹ ඇති අවබෝධතා ගිවිසුමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විගණන පරික්ෂාව. | .පිළිතුරු යවා ඇත 2023.12.19අදාල ගිවිසුම සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත . |

| | | | |
|---|---|---|---|
| 16 | SYA/D/NYSC//2023AQ/06 | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කිරීම හා භාවිතා කිරීම. | .පිළිතුරු යවා ඇත 2024.03.01 දින චක්‍රලේඛ අංක 2024.12.08 මගින් ජාතික තරුණ සේවා 2023/02 සභාවේ අධ්‍යක්ෂවරු ඇතුළු සියළු .නිලධාරින් දැනුවත් කර ඇත |
| 17 | SYA/D/NYSC//2023AQ/03// 111 | දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා පැවැත්වීම පිළිබඳ විගණන පරික්ෂාව. | .පිළිතුරක් යවා ඇත 2024.02.07මෙම පරික්ෂන වාර්තාවෙන් අනාවරණය වී ඇති කරුණු අවධානයට යොමු කර අවශ්‍ය පියවර කඩිනමින් ගැනීමට උපදෙස් ලබා දී ඇත . |
| 18 | SYA/D/NYSC//2023AQ/04 | ජාතික තරුණ සේවා සභාවේ කටයුතු ඩිජිටල්කරණය කිරීම . | .පිළිතුරක් යවා ඇත 2024.01.19 |
| 19 | SYA/D/NYSC//2023AQ/07 | ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනිම. | .පිළිතුරක් යවා ඇත 2024.02.05 |

## 08. ආශ්‍රිත වාර්තා/ලේඛන

- වාර්ෂික වාර්තාව 2022, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2023, ජාතික තරුණ සේවා සභාව.
- ක්‍රියාත්මක සැලැස්ම 2023 ජාතික තරුණ සේවා සභාව.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2023, ජාතික තරුණ සේවා සභාව.

## 09. ඇමුණුම 01 - විගණක කමිටු වාර්තාව

**විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීම හා වාර්තාකරණය.**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 4 ක් ලෙස නිර්ණය කර ඇති අතර, 2023 වර්ෂයේ කමිටු රැස්වීම් වාර 03 ක් පවත්වන ලදි. 2023 වර්ෂයේ 04 වන කාර්තුවට අදාල රැස්වීම 2023.12.12 දින පැවැත්වීමට සියලු කටයුතු සැලසුම් කර තිබුණද ගරු විෂය භාර අමාත්‍යවරයා වෙනස්වීම හේතුවෙන් පාලක මණ්ඩලය විසිරුවා හැරීම හේතුවෙන් පැවැත්වීමට නොහැකිවිය.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුලත් වාර්තාවන් සහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පින්ඩනයක් පහත දක්වා ඇත.

- රජයේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණන හා විමර්ශන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ ලබාදීම
- සමස්ථ ඉඩම් හා දේපල පවරා ගැනීමේ පටිපාටිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය
- ආයතනික සේවක මණ්ඩල කටයුතු සම්බන්ධ සමාලෝචනය
- ආයතනික සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචනය
- වාර්ෂික ගිණුම් කටයුතු සම්බන්ධව
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිළිබඳ විමර්ශනයට ලක්කිරීම

# 10. ඇමුණුම 02 - මූල්‍ය විගණක ප්‍රකාශය

ජාතික තරුණ සේවා සභාව
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
2023-12-31 දිනට

(රු.000)

| | උප. අංක | 2023-12-31 දිනට | 2022-12-31 දිනට |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 01 | 80,243 | 105,974 |
| ලැබිය යුතු දෑ | 02 | 144,546 | 155,516 |
| තොග | 03 | 8,588 | 6,193 |
| වෙනත් ජංගම වත්කම් | 04 | 382 | 525 |
| | | 233,759 | 268,208 |
| වෙනත් මූල්‍ය වත්කම් | | | |
| ආයෝජන | 05 | 1,799 | 1,799 |
| | | 1,799 | 1,799 |
| ජංගම නොවන වත්කම් | | | |
| පිරියත හා උපකරණ | 06 | 394,186 | 357,203 |
| ඉඩම් හා ගොඩනැගිලි | 07 | 2,503,899 | 2,315,448 |
| කෙරීගෙන යන වැඩ | 08 | 307,830 | 558,787 |
| ඉතිරි තොගය (පලු සම්පත්) | 09 | 14,658 | 5,225 |
| | | 3,220,574 | 3,236,663 |
| මුළු වත්කම් | | 3,456,132 | 3,506,670 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය යුතු දෑ | 10 | 118,811 | 191,935 |
| වෙනත් බැරකම් | 11 | 23,823 | 53,260 |
| | | 142,635 | 245,195 |
| ජංගම නොවන බැරකම් | | | |
| පාරිතෝෂික වෙන් කිරීම | 12 | 484,246 | 507,364 |
| මුළු බැරකම් | | 626,880 | 752,559 |
| ශුද්ධ වත්කම් | | 2,829,251 | 2,754,111 |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | | |
| වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායක වූ ප්‍රාග්ධනය | 13 | 6,554,420 | 6,408,645 |
| සංචිත | 14 | 582,857 | 582,857 |
| සමුච්චිත අතිරික්තය /(ඌනතාවය) | | (4,308,026) | (4,237,391) |
| මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය | | 2,829,251 | 2,754,111 |

........................................
කේ. ඒ.ඩී වසන්ත කුමාර
අධ්‍යක්ෂ (මුදල්)
ජාතික තරුණ සේවා සභාව

........................................
පසිඳු ගුණරත්න
තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල්/සභාපති
ජාතික තරුණ සේවා සභාව

පසිඳු ගුණරත්න
සභාපති / තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල්
ජාතික තරුණ සේවා සභාව
නො. 65, හයිලෙවල් පාර,
මහරගම.

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද, ගිණුම්කරණ සටහන් පිටු අංක 05 සිට 14 දක්වා ද, ඇතුලත් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනය කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත අත්සන් යොදා මේ සමඟ ඉදිරිපත් කෙරේ.

........................................
අසංක නිර්මල අලහකෝන්
සභා අධ්‍යක්ෂ
ජාතික තරුණ සේවා සභාව

........................................
චාමික අමරසිංහ
සභා අධ්‍යක්ෂ
ජාතික තරුණ සේවා සභාව

<u>ජාතික තරුණ සේවා සභාව</u>

<u>**2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**</u>

<u>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය</u>

| විස්තරය | උප අංක | (රු.000) 2023.12.31 | (රු.000) 2022.12.31 |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රජයේ දායකය (පුනරාවර්තන) | | 1,325,050 | 1,174,969 |
| රජයේ දායකය (සංවර්ධන) | | 411,788 | 76,552 |
| | | **1,736,838** | **1,251,521** |
| **බාහිර දායකය (පුනරාවර්තන)** | | | |
| පළාත් සභා | | 300 | - |
| අමාත්‍යංශ හා රාජ්‍ය ආයතන (පුනරාවර්තන) | | 43,330 | 44,080 |
| විදේශ සංවිධාන | | 14,033 | 553 |
| වෙනත් බාහිර ආයතන | | 4,768 | 52,267 |
| | | **1,799,269** | **1,348,421** |
| **අභ්‍යන්තර ඉපයීම්** | | | |
| ජාතික තරුණ මධ්‍යස්ථාන අදායම් (මහරගම) | **15** | 78,155 | 25,869 |
| පුහුණු මධ්‍යස්ථාන ආදායම් | **16** | 229,930 | 174,961 |
| විවිධ ආදායම් | **17** | 12,320 | 33,105 |
| සංදර්ශන ආදායම් | | 2,274 | - |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය | | 677 | 2,750 |
| අඩමාණ ණය අධි වෙන්කිරිම | | - | 35 |
| ගොවිපොල කාරක ගිණුම | **18** | 23,431 | 10,726 |
| | | **346,788** | **247,447** |
| | | **2,146,058** | **1,595,867** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| **අඩු කළා :-** | | | |
| ආයතන හා පරිපාලන වැය | **19** | 1,329,493 | 1,240,223 |
| ස්ථාවර වත්කම් ක්ෂය | | 240,447 | 274,308 |
| | | (1,569,940) | (1,514,532) |
| | | **576,118** | **81,336** |
| **තරුණ සංවර්ධන වියදම්** | **19** | | |
| සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය | 2-1 | 61,648 | 21,002 |
| මාධ්‍ය අංශය | 2-2 | 3,430 | 1,326 |
| පර්යේෂණ හා සැලසුම් අංශය | 2-3 | 4,688 | 556 |
| වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන අංශය | 2-4 | 4,116 | 309 |
| කාර්මික හා වෘත්තිය පුහුණු අංශය | 2-6 | 61,223 | 40,722 |
| ජාතික තරුණ මධ්‍යස්ථාන නඩත්තු අංශය | 2-7 | 5,900 | 4,518 |
| ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය | 2-8 | 11,429 | 6,357 |
| යෞවන තිළිණ අධිකාරි අංශය | 2-9 | 1,206 | 2,794 |
| ක්‍රීඩා සංවර්ධන අංශය | 2-10 | 157,494 | 30,599 |
| තරුණ සංවිධාන හා සංවර්ධන අංශය | 2-11 | 40,121 | 143 |
| ආදායම් ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන අංශය | 2-12 | 35,265 | 21,835 |
| තරුණ සමූපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය | 2-13 | 19,510 | 943 |
| නිස්කෝ වීඩියෝ අංශය | 2-14 | 2,736 | 1,303 |
| ඇගයීම් අංශය | 2-15 | 6,665 | 80 |
| තොරතුරු තාක්ෂණ අංශය | 2-17 | 4,824 | 1,005 |
| විශේෂ ව්‍යාපෘති අංශය | 2-18 | 24,320 | 56,675 |
| ඉඩම් අංශය | 2-19 | - | 252 |
| ජාතික තරුණ මධ්‍යස්ථානය - මහරගම | 2-6-1 | 30,120 | 14,593 |
| පුහුණු මධ්‍යස්ථාන | 2-6-1-2 | 169,695 | 132,036 |
| | | **(644,389)** | **(337,046)** |
| වර්ෂයේ අතිරික්තය/ඌනතාවය | | (68,272) | (255,710) |
| **එකතු කළා :-** | | | |
| වියදම් අතිරික්තය/ඌනතාවය (2023.01.01) | | (4,237,391) | (3,929,675) |
| පෙර වර්ෂ වියදම් ගැලපීම | | (2,363) | (52,005) |
| ඉදිරියට ගෙනා ශේෂය | | **(4,308,026)** | **(4,237,390)** |

11. ඇමුණුම 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එස්වයිඑස්/ඩී/එන්වයිඑස්සී/1/23/133    ඔබේ අංකය / உமது இல. / Your No }    දිනය / திகதி / Date } 2024 සැප්තැම්බර් 30 දින

සභාපති

ජාතික තරුණ සේවා සභාව

**ජාතික තරුණ සේවා සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික තරුණ සේවා සභාවේ ("සභාව") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සභාවට එරෙහිව කොන්ත්‍රාත්කරුවකු විසින් පවරා තිබුණු නඩුවක තීන්දුව මත 2024 වර්ෂයේදී රු.මිලියන 5.92ක් ගෙවා තිබුණද, එම අසම්භාව්‍ය බැරකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල වගකීම් ලෙස හඳුනා ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව සභාව විසින් දැනටමත් භුක්ති විඳින හා සාධාරණ අගය හඳුනාගතහැකි ඉඩම් 04ක වටිනාකම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට අනුව තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික ද්‍රව්‍ය තොගය තුළ පැවති රු.මිලියන 1.29ක භාවිතයට ගත නොහැකි අයිතම් 97කට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවලට සිදුකර නොතිබුණි.

(ඈ) 2022 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබූ රු.මිලියන 2.17ක විගණන ගාස්තුව, විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමට ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ ඌණතාවය සහ විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පෙර වර්ෂයේදී ජේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 12ක් මගින් මිලදීගෙන තිබුණු රු.මිලියන 15.46 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂයේ සභාව වෙත ලබාදී තිබුණද, එම වත්කම් සභාවේ ප්‍රධාන කාර්යාලයේ වත්කම් ලේඛනයට හෝ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී ජේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සභාව වෙනුවෙන් ලබා දී තිබුණු රු. මිලියන 6.64 ක ප්‍රතිපාදන සභාව වෙත ප්‍රේෂණය නොකර අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර තිබීමෙන් භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන හා සභාවේ ප්‍රාග්ධන ප්‍රදාන අතර රු.මිලියන 6.64 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන යටතේ (SSDP) ක්‍රියාත්මක කරන ලද කාන්තා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියෙන් හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් සභාව වෙත 2023 වර්ෂයේ හා 2015 වර්ෂයේ ලැබී තිබූ පිළිවෙළින් රු.මිලියන12.66ක සුහුරු පන්ති කාමර උපකරණවල වටිනාකම හා රු.මිලියන 63.90ක

වටිනාකමින් යුත් වාහන 10 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී දරා තිබූ රු.මිලියන 3.68ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌෟ) 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි රු.මිලියන. 2.54 ක හඳුනා නොගත් බැරවීම් පැවති අතර, 2024 අප්‍රේල් මස වන විටත් එම බැරවීම් හඳුනාගෙන අදාළ ගැලපීම් කිරීමට කටයුතු නොකිරීම නිසා එම අගය රු.මිලියන 12.52ක් දක්වා වර්ධනය වී තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.මිලියන 0.87ක අඩමාණ ණය වෙනුවෙන් වෙන්කර තිබුණද, ඊට අදාළ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) විධිමත් අනුමැතියකින් තොරව ආදායම් එකතුකිරීමේ ක්‍රියාවලියේ නිරතවී ඉතිරි කිරීම් ජංගම හා ස්ථාවර තැන්පත් විවෘත කරමින් සභාවට අයත් භෞතික හා මානව සම්පත් උපයෝජනය කර පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජ යටතේ සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.මිලියන 11.61 ක ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය, රු.20,000 ක ජංගම ගිණුම් ශේෂය හා රු.මිලියන 16.25 ක ස්ථාවර තැන්පතු ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණු අතර වර්ෂය තුළ ලද ආදායම් රු.මිලියන 8.15 ක් හා වියදම් රු.මිලියන 7.93 ක් පිළිබඳ ප්‍රකාශයක්ද පිළියෙල කර නොතිබුණි. තවද, බැංකු ජංගම ගිණුම් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කර නොතිබුණි. එබැවින් මෙම ක්‍රීඩා සමාජය විසින් රැස් කරන ලද ආදායම් හා ඒ මත දරන ලද වියදම් සහ වර්ෂය අවසානයේ පවතින ගිණුම් ශේෂ වල නිවැරදිතාවය පිළිබඳව විනිශ්චය කිරීමට නොහැකි වී තිබූ අතර මෙමගින් මූල්‍ය අක්‍රමිකතා සිදුවීමට හැකි අවස්ථාද විගණනයෙන් බැහැර කිරීමට නොහැකි විය.

(ඔ) මීරිගම පුහුණු මධ්‍යස්ථානය සඳහා තිරරෙදි මිලදී ගැනීම වෙනුවෙන් මීරිගම ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබූරු. මිලියන 2.95ක අත්තිකාරම් මුදල එම කාර්ය සඳහා 2024 සැප්තැම්බර් 20 දින වන විටත් යොදවාගෙන නොතිබියදීත් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ඌණතාවය හා අත්තිකාරම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පරිපාලිත සමාගම වෙත ගෙවිය යුතු ශේෂය ලෙස රු.මිලියන 1.18ක් දක්වා තිබුණද, පරිපාලිත සමාගම මගින් තහවුරු කළ එම ශේෂය රු.මිලියන 110.94ක් වූයෙන් ශේෂයන් අතර රු.මිලියන 109.76ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

(ක) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.මිලියන 383.13ක තරුණ සංවර්ධන වියදම්, දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ ලාභය හා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම් යනාදී අයිතමයන්ට අදාළ පිලිවෙලින් උපලේඛණ, ලාභ ගණනය කිරීම පිළිබද විස්තර හා මිලදී ගත් ක්‍රීඩා භාණ්ඩ පිළිබද විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ලංකා ජාතික තරුණ සේවා සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනයේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර

ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සභාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 මැයි 21 දිනැදිය. |

| | | |
|---|---|---|
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 08 වගන්තිය | සභාව විසින් සකස් කරන ලද අයවැය ලේඛණයෙහි අරමුදල් ලැබෙන මාර්ග පිළිබඳව පුරෝකථනය සිදු නොකර වියදම් පමණක් පුරෝකථනය කර තිබුණි. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හදුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය | චක්‍රලේඛයට පටහැනිව වෙනත් අමාත්‍යාංශ සඳහා නිලධාරීන් දෙදෙනෙකු කිසිදු අනුමැතියක් නොමැතිව මුදාහැර තිබුණි. |
| (ඈ) | 2022 ජනවාරි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015(2) | සභාවේ අධ්‍යක්ෂක ජනරාල් වරයා හා අධ්‍යක්ෂකවරු දෙදෙනෙකු චක්‍රලේඛ අනුව හිමිකම් ලබන ඉන්ධන දීමනාවට වඩා රු. මිලියන 2.48 ක ඉන්ධන උපයෝජනය කර තිබුණි. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව | සභාවේ පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන හා ගොවිපොළවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) | XV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය | දිවයිනෙන් බැහැරව යෑමේදී අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, ඊට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අධ්‍යක්ෂවරයෙකු විසින් රු.මිලියන 0.19ක් වැය දරා රේඛීය අමාත්‍යවරයාගේ අනුමැතිය මත පමණක් විදේශ සංචාරයක් සඳහා සහභාගී වී තිබුණි. |
| (ii) | XV ඡේදයේ 11.1 වගන්තිය | 2023 සැප්තැම්බර් මස 12 දින රු.මිලියන 39.40ක් වැය දරා විදේශ සංචාරයක් සඳහා ආර්ථික පන්තියේ ප්‍රවේශ පත්‍රයක් භාවිතා කිරීම වෙනුවට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රු.මිලියන. 2.77ක වැය දරා ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශපත්‍රයක් ලබාදී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඌ) | අමාත්‍යාංශය මඟින් පත්කළ කමිටුව විසින් නිකුත් කර ඇති සේවක ගැටළු හා අක්‍රමිකතා පිළිබඳ නිර්දේශයන්හි නිර්දේශ අංක 10 | නිර්දේශයට පටහැනිව තරුණ සේවා නිළධාරියෙකුට සහකාර අධ්‍යක්ෂ (ආවරණ) ඇතුළු තනතුරු 03ක් ලබාදී තිබුණි. |
| (ඍ) | 2023 මාර්තු 31 දිනැති අංක13/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | මූල්‍ය නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 06ක් සඳහා අභ්‍යන්තර උසස්කිරීම් තුළින් එය පිරවීමට තීරණය කර තිබුණද, එම තනතුරු මේ දක්වා පිරවීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එක් නිලධාරියෙකු පළාත් 02ක මූල්‍ය නිළධාරි තනතුරෙහි රාජකාරී සිදු කරමින් තිබුණි.. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ වලට යටත්ව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4 (ඊ), 5(2)(ඌ) සහ 5(2)(ඍ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආරම්භ කිරීම අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 09ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සභාවේ අරමුණුවලට අදාළ නොවන දේශගුණික විපර්යාස මැඩලීම යන මැයෙන් වූ මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලික හෝටලයක පවත්වා තිබූ වැඩසටහනක් සඳහා රු.මිලියන.1.19ක් වියදම් කර තිබුණි.

(ඇ) සභාපතිවරයාගේ අභිමතය පරිදි නිලධාරීන් හා විවිධ බාහිර ආයතන සඳහා සභාවෙ ගොඩනැගිලි නොමිලේ හෝ වට්ටම් සහිතව ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නොමැති වුවද, පෞද්ගලික ආයතන සඳහා ගොඩනැගිලි නොමිලේ සහ වට්ටම් සහිතව කුලියට ලබාදීම හේතුවෙන් රු.මිලියන 3.80ක බදු කුලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ සභාවට අහිමි කරගෙන තිබුණි.

(ඈ) යෞවන සමාජවල තරුණ තරුණියන්ගේ දායකත්වයෙන් නව නිර්මාණ එළිදැක්වීම සභාවේ එක් අරමුණක් වුවද, ඊට පටහැනිව නළු නිළියන් සම්බන්ධ කරගෙන ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කර ඒ සඳහා රු.මිලියන

4.83ක් දරා තිබූ අතර, මේ දක්වා එම ටෙලි නාට්‍ය කටයුතු ද අවසන් කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ වලට යටත්ව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

2023 නොවැම්බර් 16 දින සිට 19 දින දක්වා පැවැත්වූ 34 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම වෙනුවෙන් රු. 9,696,450 ක ආහාර, වතුර බෝතල් හා ටී-ෂර්ට් මිලදී ගැනීමේදී තරඟකාරී මිල කැඳවීමකින් තොරව මිල කමිටුවක් මගින් එය සිදුකර තිබුණි. මේ හේතුවෙන්, වෙළෙඳපොළේ පවතින තොග මිල අනුව මි.ලී. 500 පානීය ජල බෝතල් 20600 ක් රු.30 බැගින් මිලදී ගැනීමට අවස්ථාව තිබියදී, එය නොසළකා රු.70 බැගින් මිලදීගෙන තිබීමෙන් රජයට රු.මිලියන 0.82ක පාඩුවක් සිදු කර තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින නෙළුම් කුළුණ පරිශ්‍රයේදී පැවැත්වුණු සංගීතමය වැඩසටහනට සභාව විසින් රු.මිලියන 10.29ක් වැය කර තිබුණද, එම වැඩසටහන පැවැත්වීමෙන් ලද රු.මිලියන 6.86ක ටිකට්පත් ආදායම සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් 2023 හා පසුගිය වර්ෂ තුළ රු.මිලියන 4.7ක් වැයකර ඇඟිලි සළකුණු සටහන් යන්ත්‍ර මිලදීගෙන තිබුණද, එම යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබීම නිසා ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) සභාවේ පරිපාලිත සමාගමක් වන යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ ගණකාධිකාරිවරයා ලෙස සේවය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් මුදාහරින ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරියෙකු සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස රාජකාරි කරමින් සිටියදී අධ්‍යක්ෂ (මුදල්) තනතුරේද කටයුතු කිරීම සඳහා පත් කර තිබීම නිසා සභාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල වී තිබුණි.

(ඈ) සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමයේ කාර්යාල ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා කිසිදු බදු කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) තරුණ තරුණියන් නව කෘෂි තාක්ෂණයට ඉක්මණින් අනුගත කරවීම අරමුණු කොට රු.මිලියන 250 ක ප්‍රතිපාදන යටතේ 2022-2025 වර්ෂ තුල ක්‍රියාත්මක කිරීමට සකස් කරන ලද කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන හා තරුණ කෘෂි නිෂ්පාදන සමාගම් පිහිටුවීමේ වැඩසටහන කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදිද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) සභාවේ ප්‍රධාන ගබඩාවේ පැවති වටිනාකම රු.මිලියන 3.5 ක්වූ අයිතම වර්ග 37 ක් ප්‍රධාන ගබඩාවෙන් විවිධ පුද්ගලයන් හා විවිධ ආයතන වෙත තාවකාලික පදනමින් ලබා දී තිබූ අතර, ඒවා නැවත ප්‍රධාන ගබඩාව වෙත ලබා ගැනීමට හෝ වගකිව යුතු නිලධාරීන්ගෙන් එම වටිනාකම අයකර ගැනීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) 2020, 2021 සහ 2022 වර්ෂවලදී දෙහිවල පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලා සඳහා ගාස්තු ගෙවා ලියාපදිංචි නොකරන ලද සිසුන් 341දෙනෙකු සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) සහතිකපත් පිරිනමා තිබුණි. තවද, සහතිකපත් නිකුත් කිරීමේ බලයක් පුහුණු මධ්‍යස්ථානයට නොමැති වුවද, ඊට පටහැනිව සභාවේ විභාග හා ඇගයීම් අංශයෙන් සනාථ නොවුණු සහතිකපත් 791ක් පුහුණු මධ්‍යස්ථානය විසින් නිකුත් කර තිබුණි.

(ඌ) ඩ්‍රෝන තාක්ෂණය භාවිතා කර ගොවිපොළ මධ්‍යස්ථාන 11ක මැනුම් කටයුතු සඳහා පුද්ගලික ආයතන 02ක් වෙත රු.මිලියන 2.16ක් ගෙවා තිබුණද, ඒ අනුව සකස් කළ නීත්‍යානුකූල මැනුම් සටහන් මේ වන තෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) තරුණ තරුණියන් කලාපීය ජාත්‍යන්තර තරුණ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී කරගැනීමට වෙන් කරන ලද රු.මිලියන 4.89ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු) හා තවත් කාන්තාවක් පමණක් විදේශ සංචාරවලට සහභාගී වී තිබුණි.

(ඒ) යෞවන සමාජ සම්මේලනය වෙත සමාලෝචිත වර්ෂයේදී ආධාර, දීමනා හා ණය මුදලක් ලෙස පිළිවෙලින් රු.මිලියන 4.65ක් , රු.මිලියන.1.93ක් හා රු.මිලියන 5ක් ලබාදී තිබූ අතර, එලෙස ලබාදුන් මුදල් උපයෝජනය පිළිබඳ කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි. එසේම, ජාතික ක්‍රීඩා අරමුදල විසින් සභාවේ වැඩසටහනක් සඳහා ලබාදී තිබූ මුදලින් ඉතිරිව පැවති රු.මිලියන 1.4ක් ආපසු නොයවා පොළොන්නරුව දිස්ත්‍රික් යෞවන සමාජ බල මණ්ඩලය වෙත ලබාදී තිබුණි.

(ඔ) 34 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් මිලදී ගත් රු.මිලියන 0.73ක් වටිනා ටී-ෂර්ට් 768ක් එම උත්සවය නිමා වීමෙන් පසු ගබඩාවෙන් කිහිප අවස්ථාවකදී නිකුත් කර තිබූ අතර, ඉන් රු.මිලියන 0.32ක් වටිනා ටී-ෂර්ට් 337 ක් එය ලබාගත් තැනැත්තා කවුරුන්ද යන්න සඳහන් නොකර අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ලෙස සඳහන් කර

ගබඩාවෙන් නිකුත් කර තිබුණි. තවද, පාසල් හා යෞවන සමාජ මට්ටමින් බෙදාහැරීම සඳහා මිලදීගත් රු.මිලියන 0.80ක පාපන්දු 100 ක් අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය නමින් නිකුත් කර තිබුණි.

(ඞ) සේවක අර්ථසාධක අරමුදල වෙත නියමිත පරිදි දායක මුදල් ප්‍රේෂණය නොකිරීම මත රු.මිලියන 0.21ක අධිභාරයක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට සිදුවී තිබුණි.

(ක) 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැතිව බටහිර පළාත් අධ්‍යක්ෂ විසින් සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ රොබෝටික් පුහුණු පාඨමාලාව ආරම්භ කිරීමේ අරමුණින් මිලදී ගන්නා ලද රු.මිලියන 17.42 ක උපකරණ එම පාඨමාලාව ආරම්භ කිරීමට අපොහොසත් වූ බැවින් සහ නිසිලෙස අවශ්‍යතාවය පුරෝකථනය නොකොට සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් එකතුව රු.මිලියන 7.70ක් වටිනා සම්මාන 31ක් හා පුටු හා වායු සමීකරණ උපකරණ ප්‍රයෝජනයට නොගෙන මේ දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

(ග) ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර , සමාගම විසින් 2020 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ච) 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.මිලියන 144.55ක්වූ අතර, ඉන් වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 18.75ක ශේෂයක් වුවද එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ජ) 2015 වර්ෂයේ සිට විවිධ කාර්යයන් සඳහා පෞද්ගලික ආයතනවලින් ලැබී තිබූ රු.මිලියන 1.85ක ලැබීම් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ට) 2014 සිට 2023 වර්ෂයේ ආරම්භය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ධාවනයෙන් ඉවත් කරන ලද වාහන 04ක් අපහරණ කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට හෝ කටයුතු නොකර සභාවේ හා පුහුණු මධ්‍යස්ථානවල ගාල්කර තිබුණි. තවද, තවත් වාහන 10ක් වර්ෂය පුරා ධාවනය කිරීමකින් තොරව නිෂ්ක්‍රියව පැවතුණි.

(ඩ) 1994 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ දේශපාලන හේතූන් මත විවිධ ගැටළුවලට මුහුණු දුන් අයට සහන සැලසීම සඳහා අමප අංක 17/0186/734/005 දරන හා 2017 පෙබරවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශ්‍රාම නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් නොකර ඊට පටහැනිව පත් කරන ලද කමිටුවලින් නිර්දේශ ලබාගනිමින් නිලධාරීන් 40 දෙනෙකු සඳහා සහන ලබාදී තිබුණි.

(ක) සභාවේ ප්‍රධානම මාණ්ඩලික තනතුරු 03ක් වන අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ(සංවර්ධන) හා අධ්‍යක්ෂ (පුහුණු) තනතුරු සඳහා ස්ථිර පදනමින් පත්වීම් සිදු නොකර ද්විතීය හා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම වසර ගණනාවක් සිට සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් 2023 අගෝස්තු 19 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ස්ථිර පදනමින් සුදුසුකම් අනුව නිලධාරීන් බඳවා ගැනීමට අනුමත කර තිබුණද, මේ දක්වා එය සිදුකර නොතිබුණි.

(ද) සභාපතිවරයාගේ අභිමතය පරිදි සභාවේ කාර්ය මණ්ඩලයේ නොමැති ස්වේච්ඡා තනතුරක් සඳහා පුද්ගලයෙකු බඳවාගෙන ඔහු වෙත සභාවේ නේවාසිකාගාරයේ නවාතැන් පහසුකම් හා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෙන් කරන ලද වාහනය ඔහු වෙත ලබා දී ඒ සඳහා ඉන්ධන සැපයීමෙන් රාජ්‍ය සම්පත් අවිධිමත්ව පරිහරණයට ඉඩ සලසා තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති